නිපුණතා සංවර්ධන වෘත්තීය අධ්‍යාපන පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය

திறன் அபிவிருத்தி, தொழிற்சார் கல்வி, ஆராய்ச்சி மற்றும் புதிய கண்டுபிடிப்புக்கள் இராஜாங்க அமைச்சு

State Ministry of Skill Development Vocational Education Research and Innovation

# 2020




# වාර්ෂික වාර්තාව
## வருடாந்த அறிக்கை
## Annual Report

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

இலங்கை தொழிற்பயிற்சி அதிகாரசபை

Vocational Training Authority of Sri Lanka




**ආයතනය** - ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

**අමාත්‍යංශය** - නිපුණතා සංවර්ධන වෘත්තීය අධ්‍යාපන පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යංශය

**ලිපිනය** - "නිපුණතා පියස"
නො 354/2,
ඇල්විටිගල මාවත,
නාරාහේන්පිට,
කොළඹ 05.

**ඊ මේල් ලිපිනය** - info@vtasl.gov.lk

**වෙබ් අඩවිය** - www.vtasl.gov.lk

**විගණකවරු** - විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව

**බැංකුකරුවන්** - මහජන බැංකුව

# පටුන


| | |
|---|---|
| දැක්ම හා මෙහෙවර | 5 |
| කාර්යයන් | 6 |
| පිළිගැන්වීම | 7 |
| හැඳින්වීම හා ව්‍යුහය | 9 |
| අධ්‍යක්ෂ මණ්ඩලය | 9 |
| අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව | 10 |
| 2020 වසරේ ජයග්‍රහණයන් | 10-12 |
| 2021 වර්ෂය සඳහා වැඩසටහන් හා ඉලක්ක | 13-15 |
| ඉහළ හා ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාර්යය මණ්ඩලය | 15-18 |
| කාර්යය මණ්ඩල සංයුතිය හා සංවර්ධනය | 19-22 |
| වෘත්තීය පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුලින් තරුණ තරුණියන්ට වෘත්තීය පුහුණුව ලබාදීම | 23-25 |
| පුහුණු මධ්‍යස්ථාන ව්‍යාප්තිය | 26-28 |
| වෘත්තීය පුහුණු පරීක්ෂණ ඇගයීම් | 29 |
| වෘත්තීය මාර්ගෝපදේශනය හා උපදේශනය | 30 |
| රැකියාගත කිරීම | 31-32 |
| රාජ්‍ය හා පෞද්ගලික ආයතන හා එක්ව සිදුකල වැඩසටහන් | 33 |
| ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් පැවැත්වීම | 34 |
| අභියෝග | 34 |
| විගණනය හා කළමනාකරණ කමිටුව | 35 |
| මූල්‍ය ප්‍රකාශන වාර්තාව | 36-65 |
| විගණකාධිපති වාර්තාව | 66-75 |
| විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු වාර්තාව | 76-78 |

# දැක්ම

ගෝලීය රැකියා වෙළෙඳපොල අවශ්‍යතා සපුරාලන
ශ්‍රී ලංකාවේ ක්‍රියාශීලී හා නිර්මාණශීලී වෘත්තීය පුහුණුව සපයන
ප්‍රමුඛතම ආයතනය වීම

# මෙහෙවර

වෘත්තීය පුහුණු හා අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි නවීන ක්‍රමවේදයන් හා
තාක්ෂණයන් මගින් පුද්ගලයන් තුල නිපුණත්වයන් සංවර්ධනය කරමින්
ගෝලීය පුහුණු ශ්‍රම ඉල්ලුම සපුරාලීම පිණිස පහසුකම් සැලසීම.

අපගේ සේවාවන් හා පහසුකම් ඉහලම ප්‍රමිතියක
තබා ගනිමින් හා ජාත්‍යන්තර රැකියා ප්‍රවණතාවයන්
ඉලක්ක කර ගනිමින් අපි මෙම
මෙහෙවර සාක්ෂාත් කර ගන්නෙමු.

# කාර්යයන්

- වෘත්තීය පුහුණු වැඩසටහන් සකස් කිරීම හා රැකියා ගතවීම සඳහා අවශ්‍ය දක්ෂතා ලබාගත හැකිවන පරිදි සුදුසුකම් ඇති තරුණ තරුණියන්ට අවශ්‍ය වෘත්තීය පුහුණුවක් කෙලින්ම හෝ රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ නියෝජ්‍ය ආයතනයක් මගින් ලබාදීම.

- ජාතික වෘත්තීය පරීක්ෂණ, විභාග පැවැත්වීම සහ වෘත්තීය පුහුණුව ලබා ඇති ආධුනිකයන්ට සහතික සහ වෙනත් ප්‍රධාන නිකුත් කිරීම.

- වෘත්තීය පුහුණුව පිළිබඳ පර්යේෂණ පැවත්වීම හා වෘත්තීය පුහුණුව සංවර්ධනය කිරීම.

- වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන වල නිසි ප්‍රමිති පවත්වාගෙන යාම සඳහා එම මධ්‍යස්ථාන පරීක්ෂා කිරීම සහ අධීක්ෂණය කිරීම.

- අධිකාරිය විසින් වෘත්තීය පුහුණුව සඳහා සපයන ලද පහසුකම් සහ උපකරණ වෙනුවෙන් ගාස්තු හෝ වෙනත් අයකිරීම් නියම කිරීම සහ අය කිරීම.

- අධිකාරියේ කටයුතු සඳහා අවශ්‍ය යම් චංචල හෝ නිශ්චල දේපලක් අත්කර ගැනීම,දැරීම, බද්දට ගැනීම හෝ දීම, උකස් කිරීම, කුලියට ගැනීම හෝ බැහැර කිරීම.

- අධිකාරියේ පුහුණුව ලබන ආධුනිකයින් සහ සේවකයින් සඳහා මුදල් අධාර සහ සුබසාධන පහසුකම් සැපයීම.

- අධිකාරියේ කර්තව්‍ය ඉටුකිරීම සඳහා අවශ්‍ය විය හැකි සියළුම ගිවිසුම් වලට එලඹීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම.

- අධිකාරිය විසින් වෘත්තීය පුහුණුව සදහා තෝරා ගනු ලැබු ආධුනිකයින්ට වෘත්තීය පුහුණුව ලබාදීම සඳහා සේවා යෝජකයින් සමග ගිවිසුම් වලට එලඹීම.

- අධිකාරියේ ආධුනිකයින්ට වෘත්තීය පුහුණුව ලබා දීමට අදහස් කරනු ලබන සෑම සේවා යෝජකයකුම එම පුහුණුවට ප්‍රථම ආධුනිකයා සමග ගිවිසුමකට එලඹීය යුතු බවට සහ එම ගිවිසුම අධිකාරිය වෙත ලියාපදිංචි කරන බවට වග බලා ගැනීම.

- වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා උපදේශනය ලබාදීම.

# පිළිගැන්වීම

ගරු ආචාර්ය සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමා,
අධ්‍යාපන අමාත්‍ය,
අධ්‍යාපන අමාත්‍යංශය,
ඉසුරුපාය,
බත්තරමුල්ල.

ගරු ඇමතිතුමනි,

<u>වාර්ෂික වාර්තාව - 2020</u>
<u>ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය</u>

1995 අංක 12 දරණ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරි පනතේ 25 වන වගන්තිය සහ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2) C වගන්තිය ප්‍රකාරව 2020 වර්ෂයේ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙයට ,
විශ්වාසී ,

ඒ.ටී. උපාලි කැප්පිටිපොල,
සභාපති/ ප්‍රධාන විධායක නිලධාරි,
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

## හැඳින්වීම හා ව්‍යුහය

1995 අංක 12 දරණ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරී පනත යටතේ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය ස්ථාපිත කරන ලදී.

1995 අංක 12 දරණ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරී පනතේ 5 වන වගන්තියට අනුව පත් කරනු ලබන සභාපතිවරයකු, උප සභාපතිවරයකු, ඇතුළු සාමාජිකයන් 10 දෙනෙකුගෙන් ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ පාලක මණ්ඩලය සමන්විත වේ.

### අධ්‍යක්ෂ මණ්ඩලය

- දමිත වික්‍රමසිංහ මහතා
  සභාපති
  ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

- සංජය ජයමාන්න මහතා
  උප සභාපති
  ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

- බී.කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති මහතා
  කම්කරු කොමසාරිස් ජනරාල්
  කම්කරු දෙපාර්තමේන්තුව

- වින්දික ප්‍රියරත්න මහතා
  අධ්‍යක්ෂ (සැලසුම්)
  කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යංශය

- ටී.එම්.ජේ. බණ්ඩාර මහතා
  අධ්‍යක්ෂ
  මුදල් අමාත්‍යංශය

- තරංග නලින් ගම්ලත් මහතා
  සභාපති
  ජාතික ආධුනිකත්ව හා පුහුණු කිරීම් අධිකාරිය

- හද්දා විතානගේ මහත්මිය
  අතිරේක ලේකම් (පාසල් කටයුතු)
  අධ්‍යාපන අමාත්‍යංශය

- සමන් ඩී. වඩුගේ මහතා
  අධ්‍යක්ෂ
  ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යංශය

- ආර්.පී.රංජන් මහතා
  කථිකාචාර්ය

- යසිත් ගමගේ මහතා

- ස්වර්ණා නීලවල මහත්මිය

- ඩබ්.ජේ.එම්.දමිත් ලොකූ බංඩාර මහතා

2020 වර්ෂය තුලදී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 11 ක් පවත්වා ඇත.

# අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව

1995 අංක 12 දරණ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරී පනත යටතේ 1995 අගෝස්තු මස 16 වන දින ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය පිහිටුවනු ලැබීය. 2020 වර්ෂයේ දී ජාතික වෘත්තීය පුහුණු ආයතන 08 ක් දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 22 ක් හා ප්‍රාදේශියව ක්‍රියාත්මක වන වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 181 ක් හා ලියාපදිංචි වු බන්ධනාගාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථාන 05 කින් සමන්විත වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 216 මධ්‍යස්ථාන ජාලයක් ක්‍රියාත්මක කරමින් වෘත්තීය පුහුණු වැඩසටහන් 1099 ක් පූර්ණකාලීනව හා අර්ධකාලීනව 213 ක් පවත්වා යෞවන යෞවනියන් 24705 කට තම සේවය සැපයීමට සමත් වු මෙම ආයතනය මෙම වසරේ දී සිය 25 වන සංවත්සරය සමරනු ලැබීය..

**2020 වසරේ ජයග්‍රහණයන්**

- 2020 වර්ෂයේ දිවයින පුරා පිහිටි පුහුණු මධ්‍යස්ථාන 216 ක දී පූර්ණකාලීනව හා අර්ධකාලීනව වෘත්තීය පුහුණුව සඳහා තරුණ තරුණියන් 55800 ක් බඳවා ගැනීමට ඉලක්ක කරනු ලැබූවද කොවිඩ් 19 ගෝලීය වසංගත තත්වය මත 2020 වර්ෂයේ ප්‍රථම අර්ධය සඳහා බඳවා ගැනීමට හැකි වූයේ පූර්ණකාලීනව 19766 ක් හා අර්ධකාලීනව 4939 ක් වශයෙන් 24705 කි . 2020 මාර්තු මස සිට පාඨමාලා නවතා දැමීමට සිදු වූ බැවින් වර්ෂය අවසන් වන තෙක් පාඨමාලා අවසන් කිරීමට නොහැකිවිය. 2020 වර්ෂයේ පුහුණුව සඳහා ඇතුලත් වූ ආධුනිකයින්ගෙන් බහුතර සංඛ්‍යාවක් 2021 වසරේ පෙබරවාරි මාසයේදී පුහුණුව අවසන් කිරීමට නියමිතය.

- ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) සහතික 17243 කුත් (NVQ) නොවන සහතික 962 කුත් පෙර දැනුම ඇගයීම (RPL) යටතේ සහතික 648 කුත් වශයෙන් සහතික 18853 ක් නිකුත් කිරීම.

- පුහුණුව සාර්ථකව අවසන් කල ආධුනිකයන් දේශීය රැකියා අවස්ථා 2316 ක් විදේශීය රැකියා අවස්ථා 13 ක් හා ස්වයං රැකියා 426 ක් වශයෙන් 2755 දෙනෙකු රැකියා සඳහා යොමු කිරීම.

- වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් 617 ක් පැවැත්වීම මගින් 29318 දෙනෙකු වෘත්තීය පුහුණුව පිළිබඳ දැනුවත් කිරීම.

- ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන් 12 ක් පවත්වා 237 ක් සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණුව ලබාදීම

- රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ සම්බන්ධතා ගොඩනැගීමේ වැඩසටහන යටතේ (PPP) කුසලතා ප්‍රවර්ධන වැඩසටහන් 13 ක් පවත්වා වෘත්තීය පුහුණුව ලැබූ පුහුණුලාභීන් 1459 දෙනෙකුගේ නවීන තාක්‍ෂණික දැනුම හා කුසලතා යාවත්කාලීන කිරීම.

- කාර්යය මණ්ඩලයේ ධාරිතාවය වැඩි කිරීම සඳහා මානව සම්පත් සංවර්ධන වැඩසටහන යටතේ අධ්‍යන කාර්යය මණ්ඩලය සඳහා වැඩසටහන් 26 ක් මගින් 892 දෙනෙකු හා අනධ්‍යන කාර්යය මණ්ඩලය සඳහා වැඩසටහන් 06 ක් මගින් 37 දෙනෙකු සඳහා පුහුණුව ලබාදීම.

- වෘත්තීය පුහුණු අධිකාරිය සඳහා නව වෙබ් අඩවිය හා Mobile App එක හඳුන්වා දීම.

- ඩිජිටල් රූපවාහිනි නාලිකාව ආරම්භ කිරීම (Skill TV - You Tube)

- දිස්ත්‍රික් මධ්‍යස්ථානයන්හි නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ සහ පුහුණු නිළධාරීන් සඳහා කාර්යය සාධන නිර්ණායක සකස් කිරීම හා ඔවුන් ශ්‍රේණිගත කිරීම.

- Solar Technician නව පාඨමාලා 02 ක් ආරම්භ කිරීම හා ගම්පහ වේයන්ගොඩ මධ්‍යස්ථානය සඳහා තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම.

- ICT IV පාඨමාලාවන්හි ආධුනිකයින් සඳහා රැකියා අවස්ථා අඩු බැවින් අර්ධ කාලීන Level III පාඨමාලා බවට (පාඨමාලා 24 ) පරිවර්තනය කිරීම මඟින් බඳවා ගැනීම් වැඩි කිරීම සහ සමාජයේ අවශ්‍යතා සපුරාලීම.

- නියමු වැඩසටහන් (Pilot) ලෙස නාරාහේන්පිට ජාතික වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ Smart class room ස්ථාපිත කිරීම.

- 13 වසරක සහතික කළ අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන 2020 වර්ෂය සඳහා පාසල් 311 ක ක්‍රියාත්මක කළ අතර ඒ සඳහා පාඨමාලා 279 කට පාසල් සිසුන් 2074 ක් සදහා පුහුණුව ලබාදීම.

- සැළසුම් ශිල්පී (NVQ Level V) අර්ධ කාලීන පාඨමාලාව ආරම්භකර පවත්වාගෙනයාම.

- පාඨමාලා 64 ක් සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ප්‍රතීතනය ලබා ගැනීම සහ පාඨමාලා 147 ක් සඳහා ප්‍රතීතනය යාවත්කාලීන කිරීම. මේවනවිට ප්‍රතීතනය ලබා ඇති මුළු පාඨමාලා සංඛ්‍යාව 996 කි.

- IDM Nation Campus ආයතනය හා එක්ව E plus සහතික ලබාදීම සඳහා වෘත්තීය පරීක්ෂණ පවත්වා සහතික 1500 ක් ලබාදීම.

- මුහුදු ආරක්ෂක නිළධාරීන් පුහුණු කිරීම සඳහා රක්නා ලංකා ආරක්ෂක විද්‍යායතනය සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹ එම ක්ෂේත්‍රයේ පහත සඳහන් පාඨමාලා ක්‍රියාත්ම කිරීම ..

    - Private Security officer training course.
    - Train the Trainer on Private security training
    - Security Management & Consultancy course.
    - Sea Marshal Training Course

- කොරියානු භාෂා පුහුණු මධ්‍යස්ථානය සමඟ එක්ව මධ්‍යස්ථාන 09 ක කොරියානු භාෂා පුහුණු පාඨමාලා 10 ක් ආරම්භ කිරීම.

- Brandix ආයතනය සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹීම මඟින් කටාන/මහියංගනය පුහුණු මධ්‍යස්ථාන 2 නවීකරණය කිරීමට කටයුතු කිරීම.

- ACL Cable ආයතනය සමඟ එක්ව විදුලි ක්ෂේත්‍රයේ සිටින විදුලි ශිල්පීන්ට RPL ක්‍රමවේදය යටතේ අවශ්‍ය ශිල්පීය පරතරය (Gap Skill) ලබාදී NVQ සහතික ලබාදීම සඳහා අවශ්‍ය පාඨමාලා ආරම්භ කිරීම.

- ලංකා විදුලිබල මණ්ඩලය හා එක්ව එම ආයතනයේ සේවකයින් 212 ක් පාඨමාලා 11 ක් සඳහා බඳවාගෙන පුහුණු කටයුතු සිදුකිරීම.

- කොවිඩ් 19 -වසංගත තත්ත්වය හේතුවෙන් දැව තාක්ෂණ පුහුණු පාඨමාලා පැවැත්වීමට නොහැකි දිස්ත්‍රික්කයන්හි උපදේශකවරුන් සඳහා ලීමා ක්‍රියේෂන්ස් (පුද්ගලික සමාගම) සම්බන්ධ කරගනිමින් 2020.08.10 දින සිට මාස 03ක ප්‍රායෝගික පුහුණුවක් ලබාදිම.

- S-lon Lanka ආයතනය හා එක්ව ජලනල තාක්ෂණ පාඨමාලාවේ උපදේශකවරුන් සඳහා එක් දින කුසලතා සංවර්ධන පුහුණු වැඩසටහනක් පැවැත්වීම.

- GIZ ආයතනය සමඟ එක්ව හෝටල් ක්ෂේත්‍රයේ පුහුණුකරුවන් 20 ක් සඳහා දින 03 ක කුසලතා සංවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.

- ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය නිලධාරීන් 600 ක් සඳහා පරිගණක භාවිතය හා ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ අර්ධකාලීන පුහුණුව ලබාදීම.

- කොණ්ඩා සැකසුම් ශිල්පී පාඨමාලාව සඳහා අවශ්‍ය පුහුණු ද්‍රව්‍ය ලබාදීමට Bellose Lanka Pvt Ltd සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹීම.

- ඔරුගොඩවත්ත ජාතික වෘත්තීය පුහුණු ආයතනය ශ්‍රී ලාංකික ප්‍රජාවට හඳුන්වා දීමේ අරමුණු සහිතව බස්නාහිර පලාත තුල පාසල් සිසු සිසුවියන් 10,000 ක සහභාගිත්වයෙන් වෘත්තීය මාර්ගෝපදේශන ප්‍රදර්ශනයක් එම ස්ථානයේදී පැවැත්වීම.

- වෘත්තීය මාර්ගෝපදේශන හා රැකියා ප්‍රවර්ධනය අරමුණින් EDEX ප්‍රදර්ශනය, මොරටුව Cash Bonanza ප්‍රදර්ශන සහ Technocrat - 2020 තාක්ෂණික ප්‍රදර්ශනය සඳහා සහභාගිවීම.

- වෘත්තීය පුහුණු අධිකාරිය මගින් ක්‍රියාත්මක කරන පාඨමාලා වල ගුණාත්මක භාවය වැඩිකිරීම හා කර්මාන්ත හිමියන් දැනුවත් කිරීමේ අරමුණින් වෘත්තීය ක්ෂේත්‍ර 07 ක් සඳහා කර්මාන්ත හිමියන්ගේ සංසද පැවැත්වීම.

- වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය පිහිටුවීම පිළිබඳ ශක්‍යතා අධ්‍යයන 04 සිදු කිරීම.

## 2021 වසර සඳහා වැඩසටහන් හා ඉලක්ක

- සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනය අර්ථවත් කරමින් දිවයින පුරා තරුණ තරුණියන් වැඩි ප්‍රමාණයකට පුහුණු අවස්ථා සලසා දීමේ අරමුණින් 75000 කට පූර්ණකාලීන හා අර්ධකාලීනව වෘත්තීය පුහුණුව ලබාදීම. මෙම ඉලක්කයන් සපුරාලීමේ අරමුණින් “VTA ගමින් ගමට” වැඩසටහන දීප ව්‍යාප්තව සංවිධානය කරමින් ග්‍රාමීය තරුණ තරුණියන් දැනුවත් කිරීමේ පුළුල් ප්‍රචාරාත්මක වැඩසටහන් පැවත්වීම.
- ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) සහතික නිකුත් කිරීමේ ක්‍රමවේදය විධිමත් කිරීම හා (NVQ) සහතික 23000 ක් සහ (NVQ) නොවන සහතික 3000 ක් වශයෙන් සහතික 26000 ක් නිකුත් කිරීම.
- වෘත්තීය මාර්ගෝපදේශනය පිළිබඳව දිවයින පුරා පාසල් සිසුන්, පාසල් හැරගිය තරුණ තරුණියන්, වෘත්තීය පුහුණුලාභීන්ගේ දෙමව්පියන් ගුරුවරුන් හා වෙනත් සමාජ සංවිධාන සාමාජිකයන් දැනුවත් කිරීමේ වැඩසටහන් 3,122 මගින් 123,050 දෙනෙකු දැනුවත් කිරීම.
- සාර්ථකව පුහුණුව අවසන් කරන පුහුණුලාභීන් 600 ක් සඳහා ව්‍යාපාර ආරම්භ කිරීමට දිරිගැන්වීමක් ලෙස ව්‍යවසායකත්ව පුහුණු වැඩසටහන් 30 ක් පවත්වා 150 දෙනෙක් සඳහා SEPI ණය යෝජනා ක්‍රමය යටතේ ව්‍යාපාර ආරම්භ කිරීමට සහ පවත්නා ව්‍යාපාර සංවර්ධනය සඳහා මූල්‍ය පහසුකම් සලසා දීම.
- පුහුණුව අවසන් කරන ආධුනිකයන් 8,200 ක් දේශීය රැකියා සඳහාත් 500 ක් විදේශීය රැකියා සඳහාත් 1,250 ක් ස්වයං රැකියා සඳහාත් ලෙස 9,950 ක් රැකියා සඳහා යොමු කිරීම.
- පුහුණුව අවසන් කරන ආධුනිකයන් රැකියාගත කිරීම හා වැඩිදුර පුහුණු අවස්ථා ලබාදීම අරමුණු කරගෙන රැකියා වෙළඳපොළ 05 ක් පැවැත්වීම.
- පුහුණුව ලබන ආධුනිකයන්ගේ දැනුම කුසලතා වැඩි දියුණු කිරීමේ අරමුණින් කර්මාන්තශාලා නිරීක්ෂණ චාරිකා 70 ක් සංවිධානය කිරීම.
- වෘත්තීය පුහුණුව ලැබූ පුහුණුලාභීන්ට ක්ෂේත්‍රය තුළ දැනුම හා තාක්ෂණික කුසලතා යාවත්කාලීන කිරීමේ අරමුණු ඇතිව කුසලතා ප්‍රවර්ධන වැඩසටහන් 60 ක් නිපුණ ශිල්පීන් 3,660 සඳහා පැවැත්වීම.
- වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයතුල නව ප්‍රවණතා පිළිබඳ දැනුවත් කිරීම හා කර්මාන්ත ක්ෂේත්‍රයේ නව ප්‍රවණතා හඳුනා ගැනීමේ අරමුණින් කර්මාන්ත හිමියන් දැනුවත් කිරීමේ වැඩ මුළු 24 ක් පැවැත්වීම.
- වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන වල ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීමේ අරමුණින් තත්ව වැඩිදියුණු කිරීමෙ පද්ධති (QIS) වැඩසටහන් 20 ක් සහ තත්ව කළමණාකරණ පද්ධති (QMS) වැඩසටහන් 10 ක් ක්‍රියාත්මක කිරීම.
- කුසලතා සංවර්ධන පුහුණු වැඩසටහන් (Skills upgrading programme) 15 ක් පුහුණු ක්‍රමවේදය වැඩසටහන් (TMP) 12 ක් ක්‍රියාත්මක කිරීම.
- මෝටර් රථ කාර්මික ශිල්පී පුහුණු පාඨමාලා 05 ක් සඳහා Hybrid තාක්ෂණය ඉගැන්වීමට අවශ්‍ය පහසුකම් වැඩි කර ක්‍රියාත්මක කිරීම.
- උතුරු පළාතේ පරිවාසගත දරුවන්ගේ නිපුණතා සංවර්ධන කටයුතු සඳහා පරිවාස හා ළමා ආරක්ෂක සේවය සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹීම.
- ඡායාරූපකරණය පිළිබඳ NVQ සහතික ප්‍රදානය සඳහා පුහුණු පාඨමාලා ආරම්භ කිරීමට ඉන්ද්‍රනාථ තේනුවර ෆොටෝ ඇකඩමිය සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹීම.
- තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ NVQ Level V උපදේශකවරුන්ගේ හා පුහුණුලාභීන්ගේ දැනුම යාවත්කාලීන කිරීම සඳහා SLASCOM ආයතනය මඟින් හඳුන්වා දී ඇති පාඨමාලා සමඟ සම්බන්ධ කිරීම.
- තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ උපදේශකවරුන්හට කර්මාන්තගත පුහුණුව සඳහා සම්බන්ධ වීමට අවස්ථාව සළසාදීම.

- සංචාරක රියදුරු පාඨමාලාව ආරම්භ කිරීමට සංචාරක සංවර්ධන අධිකාරිය සමඟ එක්ව ගිවිසුමකට එළඹීම.
- ඉදිකිරීම් තාක්ෂණ ක්ෂේත්‍රයේ ආයතන (Access, Maga) හා සම්බන්ධවී පූර්ණ කාලීන (පැය 360) පාඨමාලා ආරම්භ කිරීම.
- 13 වසරක සහතික කළ අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන ක්‍රියාත්මකවන පාසල් 423 කින් අපගේ පුහුණු පාඨමාලා 350 කට ආධුනිකයින් 5000 ක් බඳවා ගැනීම.
- JLPT විභාගය සඳහා ආධුනිකයින් පුහුණු කරවීමට අර්ධ කාලීන ජපන් භාෂා පුහුණු පාඨමාලා ආරම්භ කිරීම.
- Baurs Pvt Ltd සමඟ එක්ව Swiss (ස්විස්) හෝටල් කළමණාකරණ පාඨමාලා ආරම්භ කිරීමට ගිවිසුමකට එළඹීම.
- Apparel Design  Technician (NVQ level IV) නව පාඨමාලා 15 ක් හඳුන්වාදීම.
- Keels ආයතනය සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹ Customer Service Associate පාඨමාලාව ආරම්භ කර ආධුනිකයින් එම ආයතනයේ රැකියාගත කිරීම.
- You Lead Sri Lanka ආයතනය සමඟ එක්ව හෝටල් ක්ෂේත්‍රයේ Baker, Cook ,Food) Beverage, Room Attendant පාඨමාලාවල උපදේශකවරුන් සඳහා TOT ලබාදීම සහ පුහුණුලාභීන් සඳහා මෘදු කුසලතා/ආකල්ප සංවර්ධන වැඩසටහන්  අඛණ්ඩව සිදුකිරීම.
- GIZ ආයතනය සමඟ එක්ව හෝටල් ක්ෂේත්‍රයේ පුහුණුලාභීන් සඳහා මෘදු කුසලතා/ආකල්ප සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා උපදේශකවරුන් සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම අඛණ්ඩව සිදුකිරීම.
- නූතන තරුණ පරපුර උද්‍යෝගිමත්ව  ඉදිකිරීම් ක්ෂේත්‍රයට ආකර්ෂණය කර ගැනීමේ අරමුණින් Chamber of Construction Industry Sri Lanka ආයතනය සමඟ එක්ව විරු පවුර "Viru Paura" වැඩසටහන යටතේ සමාජ මාධ්‍ය ඔස්සේ තරුණ ප්‍රජාව දැනුවත්කර Block laying Technician,Tilling Technician, Rigging Technician, Painting Technician පාඨමාලා ආරම්භ කිරීම.
- "Be Pro" "සැබෑ වෘත්තිකයෙකු වන්න" යන තේමාව යටතේ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය නැවුම් මුහුණුවරකින් භෞතික හා මානව සම්පත් සංවර්ධනය කොට ශ්‍රී ලාංකික තරුණ පරපුර දැනුමෙන් හා කුසලතාවයෙන් සන්නද්ධ කොට ඔවුන්ගේ ජීවන තත්වය වර්ධනය කිරීමේ අරමුණින් "විකසිත" වැඩසටහන ක්‍රියාත්මක කිරීම. එයට සමගාමීව යොවුන් ව්‍යවසායකයින් බිහිකිරීම.
- ශ්‍රී ලාංකීය කාන්තාව ශක්තිමත් කිරීමේ අරමුණින් වෘත්තීය පුහුණු අධිකාරිය මඟින් පුහුණුව ලබන පුහුණුලාභීන් විදේශ රැකියා සදහා යොමු කිරීම සඳහා Care Giver Level IV පුහුණුව සමගින් ජපන් භාෂා නිපුණතාවය ලබා දීමේ විශේෂ වැඩසටහන "රැකවරණී" යන නමින් ක්‍රියාත්මක කිරීම.
- QIS වැඩසටහන් 15 ක් සහ QMS වැඩසටහන් 08 ක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම.
- අර්ධ කාලීන පාඨමාලාව ආරම්භ කිරීමට කටයුතු කිරීම.
    - රූපලාවන්‍ය හා කොණ්ඩා සැකසුම් පාඨමාලාව (NVQ Level VI)
    - මනාලියන් හැඩගැන්වීම
    - දෙමළ මාධ්‍ය පුහුණු ආධුනිකයින්  සඳහා සිංහල භාෂා පුහුණු වැඩසටහන්
    - CNC Operator  (Turning & Milling)
    - Auto Cad 2 D (Computer aided Designer )
    - Auto Cad 3 D (Computer aided Designer )
- ගමනාගමන මණ්ඩලයේ කාර්යය මණ්ඩලය සඳහා තොරතුරු තාක්ෂණය සහ ව්‍යාපාර කළමණාකරණ පාඨමාලාව යාවත්කාලීනව පවත්වාගෙනයාම.

- SSDP ව්‍යාපෘතිය යටතේ කෑගල්ල බල්ලපාන මධ්‍යස්ථානය සංවර්ධනය කිරීම සහ යටිතල පහසුකම් සැපයීම (Business plan) මේ වනවිට සිදුකරමින් පවතින අතර 2021 වර්ෂයට එවැනි මධ්‍යස්ථාන 14 ක් සංවර්ධනය කිරීම.
- විදේශ සේවා නියුක්ති කාර්යාංශය සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹ ඇති අතර පුහුණු ශ්‍රමිකයින් විදේශ රැකියා සඳහා යොමු කිරීම ආරම්භ කිරීම.
- SLASCOM සහ ORACAL ආයතන සමඟ එක්ව තොරතුරු තාක්ෂණ උපදේශකයින් සඳහා කුසලතා සංවර්ධන පුහුණු වැඩසටහන් ආරම්භ කිරීම.
- මාස 06 පෑස්සුම් පාඨමාලා සඳහා ලෝහ පිරිසැකසුම් ක්ෂේත්‍රයට අදාළ මොඩියුල ඇතුලත්කර එක් අවුරුදු පාඨමාලාවක් ලෙස පවත්වාගෙන යාම.
- පසුගිය වසර පහ තුළ වෘත්තීය පුහුණු අධිකාරියේ මෝටර් කාර්මික ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක පාඨමාලා වල පවතින ගැටළු හා අභියෝග හඳුනා ගැනීමේ සෙවුම් අධ්‍යයනක් සිදුකිරීම.

දමිත වික්‍රමසිංහ,
සභාපති/ ප්‍රධාන විධායක නිලධාරි,
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය.

## ඉහළ හා ජ්‍යෙෂ්ඨ කළමණාකරණ කාර්යය මණ්ඩලය

-

**සභාපති**

දමිත වික්‍රමසිංහ මහතා

**උප සභාපති**

සංජය ජයමාන්න මහතා (2020.03.02)

**අධ්‍යක්ෂ ජනරාල්**

එච්. චූලාංගනී පෙරේරා මිය

**අධ්‍යක්ෂවරු**

1. ඩබ්.ඒ. රණවීර මහතා (මානව සම්පත් හා පරිපාලන)
2. සමන් කුලසූරිය මහතා (වෘත්තීය මාර්ගෝපදේශන,රැකියා ගතකිරීම් හා ප්‍රවර්ධන)
3. යු.කේ. නන්ද මහතා (පරීක්ෂණ හා ඇගයීම් )
4. එස්.එම්. විදිරිසිංහ මිය (පුහුණු)
5. පී.එච්.පී. දමයන්ති මිය (සැලසුම් පර්යේෂණ හා සංවර්ධන) වැ.බ. (2020.05.20 දින දක්වා)
6. ජේ. ඒ.ඩී.එස්.නිශාමනී මිය (මුදල්) (2019.12.19 සිට වැඩ බැලීම)
7. එම්.ඒ.නජීඩ් අහමඩ් මහතා
   (සැලසුම් පර්යේෂණ හා සංවර්ධන 2020.05.21 සිට ද්විතීයන පදනම මත)

**ප්‍රධාන අභ්‍යන්තර විගණක**

1. ආර්. පී. හෙට්ටිආරච්චි මහතා (රාජකාරී ඉටු කිරීම)

**නියෝජ්‍ය අධ්‍යක්ෂවරු**

1. එන්.ඩී.පී. ධම්මික මහතා (2020.09.01 දින සිට විශ්‍රාම)
2. ආර්.එන්.කේ.එම්.ජේ. සෙනෙවිරත්න මහතා (2020.10.26 දින සිට විශ්‍රාම)
3. එන්.එස්.ඩී. නවරත්න මහතා
4. ඩී.ආර්.එස්.එල්. දසනායක මහතා
5. ජී.ඒ.ඩී.එස් සේනාරත්න මහතා
6. ජී.වී.පී.එන්. පෙරේරා මහතා
7. එච්.ඩබ්. රොහාන් ප්‍රියන්ත මහතා
8. ඩබ්.ජී. විජේරත්න මහතා
9. ඒ.එම්.ටී.එස්. ආටිගල මහතා
10. වී. කනගසුන්දරම් මහතා
11. ටී. විනෝදරාජා මහතා
12. පී.එන්. අබේසිංහ මහතා
13. ඩී.ඒ.එස්. අතුකෝරල මහතා
14. ආර්.එම්.ආර්.රත්නායක මහතා
15. බී.එච්.ඒ. නෙල්සන් මහතා
16. එච්.ඒ.පී. ගුණවර්ධන මහතා
17. එම්.ජී.ජී. සමන් මහතා
18. ආර්. සුනිල් මහතා
19. පී.එච්.පී.දමයන්ති මිය
20. එන්.එම්.වී.කේ. හේරත් මිය
21. එම්.කේ.බී.ජයතිලක මහතා
22. වී.ජී. නිමල්සිරි මහතා
23. එස්. මැද්දේගොඩ මහතා
24. එම්.බී.නලීම් මහතා
25. ආර්. පතිරගේ මිය.
26. ඒ.ඒ.ජබීර් මහතා (2020.02.19)
27. පී.එල්.ඒ.පීරිස් මහතා
28. සී.ජේ.විදානපතිරණ මහතා
29. කේ.ඩී.එන්. ද සිල්වා මහතා
30. පී.ජේ. ජයවර්ධන මිය
31. ඩබ්ලිව්.එම්.ඒ.එස්.එල්.විජේනායක මිය.

**සහකාර අධ්‍යක්ෂවරු**

1. රාධ ක්‍රිෂ්ණන් මයුරතන් මහතා
2. කේ. නිරංජන් මහතා
3. ඒ.ඒ.ඩබ්.ජී.ආර්.ආර්. බණ්ඩාර මහතා
4. පී.ජී. ප්‍රසන්න මහතා
5. එච්. එදිරිසිංහ මිය
6. ඒ.ඒ.ඩී.ටී. ශාන්ත මහතා
7. ටී.වී.ඩබ්. දේවප්‍රිය මහතා
8. යූ.ජී.ජේ.ප්‍රියදර්ශන මහතා
9. ආර්.ඩී. ප්‍රදීපිකා මිය
10. ඊ.ජේ. විජේතුංග මහතා
11. එච්.එල්. සිසිර මහතා
12. ඩබ්ලිව්.කේ. සුමිත් වසන්ත මහතා
13. ආර්. අභිලන් මහතා
14. එච්.ටී.ඩී.ආර්.එස්. විජේසිංහ මහතා
15. තිළිණ රණසිංහ මහතා
16. ජී.ඩී. ශ්‍යාමලී මිය
17. සී.ඩී. සමරනායක මහතා
18. සී.යූ.එම්. කොඩිතුවක්කු මිය
19. සුනිල් අබේසිංහ මහතා
20. ජී.කේ.ඩී.සී. කුමාර මහතා
21. එස්.එම්.ජේ. සුවේන්ද්‍ර මහතා
22. එස්.එම්.එම්.කේ. සියමුදලි  මිය
23. එන්.කේ. අඹගහවත්ත මිය
24. ඩී.සී.ඕ. විතාන මිය
25. ඒ.ඩී.එස්. සමරසිංහ මහතා
26. ඒ.පී. ජගත් නිශාන්ත මහතා
27. එල්.පී.කේ.ඩබ්ලිව්. වැලිවත්ත මහතා
28. ඩී.එම්. යහම්පත් මහතා
29. කේ.පී.ඩී.පී. සිරිසේන මහතා
30. එන්.ඒ.ඒ.ඩී. නාගහවත්ත මහතා
31. එම්.එම්.එන්.බී.මධුරසිංහ මහතා
32. එන්.ඩී.ඩී.එදිරිසිංහ මිය
33. එන්.ටී.දළුවත්ත මිය
34. එම්. පී. හර්ෂණ කුසුම්සිරි මහතා
35. ඩී.එම්.පී.එස්. අතුකෝරළ මහතා
36. ජේ.ඉනෝකා යූ.පී.ගුණවර්ධන මෙනෙවිය
37. පී.බී.ජී.අයි.බී. වැගන්තලේ මහතා
    (2020.03.03 දින සිට සේවය හැර ගොස් ඇත)

**නීති නිලධාරි**

38. ඩී.එම්.එච්.ජී.ඒ.ඩී.වී.කුමාරි මිය.(2019.10.14 සිට 2020.01.12 දින දක්වා)
39. ඩී. ඒ.එස්. ආලෝකා ද සිල්වා මිය (2020.07.01 දින සිට)

## කාර්යය මණ්ඩල සංයුතිය හා සංවර්ධනය

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදනයන්ට අනුව 2020.12.31 දිනට ඒ ඒ තනතුරු මට්ටමින් 1914 දෙනෙකු සේවයේ යෙදී සිටි ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරියේ 2020 වර්ෂය සඳහා අනුමත කාර්යය මණ්ඩලය 2656 කි.

| | තනතුර | අනුමත කාර්යය මණ්ඩලය | වසර අවසානය වන විට කාර්යය මණ්ඩලය | වර්ෂය අවසානයේ පුරප්පාඩු / අතිරික්තය | සේවා කාණ්ඩය |
|---|---|---|---|---|---|
| 01 | අධ්‍යක්ෂ ජනරාල් | 1 | 1 | 0 | HM 2-1 |
| 02 | අධ්‍යක්ෂ | 6 | 5 | 1 | HM1-1 |
| 03 | ප්‍රධාන අභ්‍යන්තර විගණක | 1 | 0 | 1 | |
| 04 | විදුහල්පති | 1 | 0 | 1 | MM 1-3 |
| 05 | නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ | 85 | 64 | 21 | MM 1-1 |
| 06 | සහකාර අධ්‍යක්ෂ - ප්‍රසම්පාදන | 1 | 1 | 0 | |
| 07 | සහකාර අධ්‍යක්ෂ - අධ්‍යයන | 3 | 0 | 3 | |
| 08 | සහකාර අධ්‍යක්ෂ - කාර්මික | 1 | 0 | 1 | |
| 09 | සහකාර ලේඛකාධිකාරී | 01 | 0 | 01 | |
| 10 | නීති නිළධාරී | 1 | 1 | 0 | |
| 11 | අභ්‍යන්තර විගණක | 1 | 1 | 0 | |
| 12 | ඉංජිනේරු | 1 | 0 | 1 | |
| 13 | පරිපාලන නිළධාරී | 3 | 2 | 1 | JM 1-1 |
| 14 | පරීක්ෂණ හා ඇගයීම් නිළධාරී | 13 | 9 | 4 | |
| 15 | විමර්ශන නිළධාරී | 1 | 1 | 0 | |
| 16 | ප්‍රවාහන නිළධාරී | 1 | 0 | 1 | |
| 17 | සැපයුම් නිළධාරී | 1 | 1 | 0 | |
| 18 | මුද්‍රණ නිළධාරී | 1 | 0 | 1 | |
| 19 | අභ්‍යන්තර විගණන නිළධාරී | 3 | 3 | 0 | |
| 20 | පද්ධති විශ්ලේෂක | 1 | 0 | 1 | |
| 21 | සුභසාධක නිළධාරී | 1 | 1 | 0 | |
| 22 | ගිණුම් නිළධාරී | 33 | 32 | 1 | |
| 23 | ජ්‍යෙෂ්ඨ වැඩසටහන් නිළධාරී | 10 | 10 | 0 | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 24 | පුහුණු නිළධාරී | 98 | 62 | 36 | |
| 25 | පර්යේෂණ නිළධාරී | 2 | 2 | 0 | |
| 26 | සැළසුම් නිළධාරී | 2 | 2 | 0 | |
| 27 | සභාපති සඳහා වූ පෞද්ගලික සහකාර | 1 | 0 | 1 | |
| 28 | පෞද්ගලික සහකාර | 7 | 5 | 0 | |
| 29 | භාෂා පරිවර්තක (සිංහල/ඉංග්‍රීසි) | 1 | 0 | 1 | MA 5-2 |
| 30 | භාෂා පරිවර්තක (සිංහල/දෙමල) | 3 | 0 | 3 | |
| 31 | ජ්‍යෙෂ්ඨ උපදේශක | 201 | 124 | 77 | MA 4 |
| 32 | වැඩසටහන් නිළධාරී | 70 | 62 | 8 | |
| 33 | විගණන සහකාර * | 3 | 0 | 0 | |
| 34 | සහකාර පුස්ථකාලාධිපති | 1 | 0 | 1 | MA 3 |
| 35 | ව්‍යාපෘති සහකාර * | 34 | 7 | 0 | |
| 36 | තාක්ෂණික සහකාර | 3 | 1 | 2 | MA 2-2 |
| 37 | උපදේශක | 1529 | 1108 | 421 | |
| 38 | ක්‍රීඩා උපදේශක | 31 | 0 | 31 | |
| 39 | සැලසුම් ශිල්පී | 1 | 0 | 1 | |
| 40 | ප්‍රමාණ සමීක්ෂක | 2 | 0 | 2 | |
| 41 | කාර්මික නිලධාරී(සිවිල්) | 5 | 0 | 5 | |
| 42 | කළමනාකරණ සහකාර | 196 | 169 | 27 | MA 1-2 |
| 43 | සහකාර උපදේශක (LRUC)* | 38 | 31 | 0 | |
| 44 | ඇමුණුම්කරු (මුද්‍රණ) | 3 | 1 | 2 | |
| 45 | නිවාඩු නිකේතන භාරකරු | 2 | 0 | 2 | |
| 46 | සුපරීක්ෂක (මුද්‍රණ) | 1 | 0 | 1 | |
| 47 | සුපරීක්ෂක (ගොඩනැගිලි) | 1 | 0 | 1 | |
| 48 | රියදුරු | 67 | 62 | 5 | PL 3 |
| 49 | ගබඩාකරු * | 2 | 2 | 0 | PL 2 |
| 50 | මුද්‍රණ සහයක | 3 | 2 | 1 | |
| 51 | බැඳුම්කරු (මුද්‍රණ) | 2 | 1 | 1 | |
| 52 | යන්ත්‍ර ක්‍රියාකරු (මුද්‍රණ) | 2 | 2 | 0 | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 53 | කාර්යාල සහයක | 8 | 5 | 3 | PL 1 |
| 54 | මුරකරු * | 65 | 38 | 0 | |
| 55 | කම්කරු | 101 | 96 | 5 | |
| | **එකතුව** | **2656** | **1914** | **676** | |

* දැනට සිටින පුද්ගලයින්ට පෞද්ගලික වන සේ එම තනතුර අනුමත කර ඇත. ඉන්පසු අහෝසි වේ.

## කාර්යය මණ්ඩල සංයුතිය (සේවා කාණ්ඩය අනුව)

| | **තනතුර** | **අනුමත කාර්යය මණ්ඩලය** | **වසර අවසානය වනවිට කාර්යය මණ්ඩලය** | **වර්ෂය අවසානයේ පුරප්පාඩු / අතිරික්තය** |
|---|---|---|---|---|
| 01 | HM 2- ජ්‍යෙෂ්ඨ කළමනාකාර<br>HM 1-1 ජ්‍යෙෂ්ඨ කළමනාකාර | 08 | 05 | 02 |
| 02 | MM 1-1 කළමනාකාර | 95 | 67 | 28 |
| 03 | JM 1-1 කණිෂ්ඨ කළමනාකාර | 178 | 130 | 46 (*05 Personal) |
| 04 | MA 5-2 බලාත්මක කිරීමේ / ක්‍රියාත්මක කිරීමේ / ව්‍යාප්ති නිලධාරීන් | 04 | 0 | 04 |
| 05 | MA 4 ක්‍රියාත්මක කිරීමේ/ උපදේශන සේවා | 274 | 186 | 85 |
| 06 | MA 3 ආශ්‍රිත නිලධාරීන් | 35 | 07 | 1 (*07 Personal) |
| 07 | MA 2-2 කළමනාකරණ සහකාර-තාක්ෂණ | 1571 | 1109 | 462 |
| 08 | MA 1-2 කළමනාකරණ සහකාර* තාක්ෂණ නොවන | 241 | 201 | 33 (*32 Personal) |
| 09 | PL 3 ප්‍රාථමික ශිල්පී | 67 | 62 | 05 |
| 10 | PL 2 ප්‍රාථමික අර්ධ ශිල්පී | 09 | 07 | 02 (*02 Personal) |
| 11 | PL 1 ප්‍රාථමික ශිල්පී නොවන | 174 | 139 | 08 (*38 Personal) |
| | **එකතුව** | **2656** | **1914** | **676** |

* දැනට සිටින පුද්ගලයින්ට පෞද්ගලික වන සේ එම තනතුර අනුමත කර ඇත. ඉන්පසු අහෝසි වේ.




**කාර්යය මණ්ඩලයේ දැනුම, ආකල්ප හා කුසලතා වර්ධනය කිරීම.**

2020 වර්ෂයේ දී පහත වර්ගීකරණයක් යටතේ කාර්යය මණ්ඩලය පුහුණු වැඩසටහන් සඳහා සහභාගී කරවීමට හැකිවිය.

| | **වැඩසටහන් සංඛ්‍යාව** | **සහභාගිවූ සංඛ්‍යාව** |
|---|---|---|
| අධ්‍යයන | 26 | 892 |
| අනධ්‍යයන | 6 | 37 |



## වෘත්තීය පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුලින් තරුණ තරුණියන්ට වෘත්තීය පුහුණුව ලබාදීම

2020 වර්ෂයේ පූර්ණකාලීන හා අර්ධකාලීන පාඨමාලා 132 කට ඇතුලත් වන පුහුණු වැඩසටහන් 1312 ක් දිවයින පුරා ක්‍රියාත්මක කර ආයතනික පුහුණුව ලැබූ ආධුනිකයින් සංඛ්‍යාව 24705 කි.

**වෘත්තීය පුහුණුව සඳහා ඇතුලත් වීම / පුහුණුව අවසන් කිරීම**

| වර්ෂය | 2018 | 2019 | 2020 |
|---|---|---|---|
| පුහුණුවට ඇතුලත් වූ සංඛ්‍යාව | 36,667 | 37,936 | 24,705 |
| පුහුණුව අවසන් කල සංඛ්‍යාව | 29,616 | 30,674 | 1,256 |

* කොවිඩ් 19 ගෝලීය වසංගත තත්වය මත 2020 වර්ෂයේ පුහුණුව සඳහා ඇතුලත් වූ ආධුනිකයින්ගෙන් බහුතර සංඛ්‍යාවක් 2021 වසරේ පෙබරවාරි මාසයේදී පුහුණුව අවසන් කිරීමට නියමිතය.

**වෘත්තීය පුහුණුව සදහා ඇතුලත් වීම/පුහුණුව අවසන් කිරීම**



## පුහුණු පාඨමාලා ක්ෂේත්‍ර අනුව ආධුනික බඳවා ගැනීම -2020

| | ක්ෂේත්‍රය | ඇතුලත් වු ආධුනික සංඛ්‍යාව (ආයතනික පුහුණුව) | ප්‍රතිශතය |
|---|---|---|---|
| 1 | කෘෂිකර්ම වැවිලි හා පශු සම්පත් | 30 | 0.12 |
| 2 | මෝටර් රථ අලුත්වැඩියා හා නඩත්තුව | 2,074 | 8.63 |
| 3 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 2,147 | 8.69 |
| 4 | විදුලි හා විද්‍යුත් සහ විදුලි සංදේශ | 2,670 | 10.81 |
| 5 | ධීවර හා මත්ස්‍ය වගාව | 41 | 0.17 |
| 6 | ආහාර තාක්ෂණය | 758 | 3.07 |
| 7 | මැණික් හා ස්වර්ණාභරණ | 113 | 0.46 |
| 8 | හෝටල් හා සංචාරක | 1,651 | 6.68 |
| 9 | තොරතුරු තාක්ෂණ සන්නිවේදනය හා බහු මාධ්‍ය තාක්ෂණය | 6,625 | 26.82 |
| 10 | සම් ආශ්‍රිත නිෂ්පාදන | 24 | 0.10 |
| 11 | ලෝහ හා ලුහු ඉංජිනේරු | 979 | 3.96 |
| 12 | කාර්යාල කළමණාකරණය | 128 | 0.52 |
| 13 | දැව ආශ්‍රිත | 606 | 2.45 |
| 14 | පුද්ගල හා සමාජ | 3,950 | 15.99 |
| 15 | මුද්‍රණ හා ඇසුරුම් | 36 | 0.15 |
| 16 | ශීතකරණ හා වායුසමීකරණ | 492 | 1.99 |
| 17 | රෙදිපිළි හා ඇගළුම් | 2,183 | 8.84 |
| 18 | සෞඛ්‍ය හා සමාජ කටයුතු | 36 | 0.15 |
| 19 | වෙනත් | 104 | 0.42 |
| | **එකතුව** | **24,705** | **100.00** |

### පුහුණුවට බඳවා ගැනීම -2020



රැකියා අවස්ථා බහුල ශ්‍රම වෙළඳපොල ඉල්ලුම සහිත පාඨමාලා සඳහා ඇතුලත්වන ආධුනික සංඛ්‍යාව සමස්ථ ඇතුලත් විමෙන් 39.25% කි.

| ක්ෂේත්‍රය | පිරිමි | ගැහැණු | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| මෝටර් රථ අලුත්වැඩියා හා නඩත්තුව | 2,074 | 58 | 2,132 | 8.63 |
| ගොඩනැගිලි හා ඉදිකිරීම් | 1,684 | 463 | 2,147 | 8.69 |
| විදුලි, විද්‍යුත් සහ විදුලි සංදේශ | 2,623 | 47 | 2,670 | 10.81 |
| හෝටල් හා සංචාරක | 1,394 | 257 | 1,651 | 6.68 |
| දැව ආශ්‍රිත | 594 | 12 | 606 | 2.45 |
| ශීතකරණ හා වායුසමීකරණ | 492 | 0 | 492 | 1.99 |
| **එකතුව** | **8,861** | **837** | **9,698** | **39.25** |



# පුහුණු මධ්‍යස්ථාන ව්‍යාප්තිය

2020 වර්ෂයේ දිවයින පුරා ක්‍රියාත්මක වූ පුහුණු මධ්‍යස්ථාන සංඛ්‍යාව පහත පරිදි වේ. එයට අමතරව බන්ධනාගාර 16 කත්, පුනරුත්ථාපන මධ්‍යස්ථාන 02 කත් වෘත්තීය පුහුණු පාඨමාලා පැවැත්විය.

| පුහුණු මධ්‍යස්ථාන | 2018 | 2019 | 2020 |
|---|---|---|---|
| ජාතික වෘත්තීය පුහුණු ආයතනය | 07 | 08 | 08 |
| දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන | 22 | 22 | 22 |
| වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන | 191 | 181 | 181 |
| තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි අනෙකුත් මධ්‍යස්ථාන (බන්ධනාගාර හා පුනරුත්ථාපන) | 06 | 05 | 05 |
| **එකතුව** | **226** | **216** | **216** |

**පුහුණු මධ්‍යස්ථාන ව්‍යාප්තිය -2020**



## වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන ව්‍යාප්තිය 2020

| පළාත | දිස්ත්‍රික්කය | ආයතන සංඛ්‍යාව | | | | | | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| | | NVTI | DVTC | VTC | AT | PC | Reh | |
| බස්නාහිර | ගම්පහ | - | 1 | 14 | 3 | [1] | - | 16 |
| | කොළඹ | 3 | 1 | 10 | 1 | [1] | - | 15 |
| | කළුතර | - | 1 | 7 | 1 | 1 | - | 08 |
| වයඹ | පුත්තලම | - | 1 | 6 | - | - | - | 07 |
| | කුරුණෑගල | - | 1 | 7 | - | - | - | 08 |
| උතුර | යාපනය | - | 1 | 5 | 0 | - | - | 06 |
| | කිලිනොච්චිය | - | 1 | 4 | - | - | - | 05 |
| | මුලතිව් | - | 1 | 2 | 1 | - | - | 03 |
| | මන්නාරම | - | - | 1 | - | - | - | 01 |
| | වව්නියාව | - | 1 | 3 | 4 | - | - | 04 |
| නැගෙනහිර | ත්‍රිකුණාමලය | - | 1 | 8 | - | - | - | 09 |
| | මඩකලපුව | 1 | - | 10 | - | - | - | 11 |
| | අම්පාර | - | 1 | 12 | 1 | - | - | 13 |
| දකුණ | ගාල්ල | 2 | 1 | 12 | 3 | 2 | - | 15 |
| | මාතර | 1 | - | 12 | - | - | - | 13 |
| | හම්බන්තොට | 1 | 1 | 09 | - | [1] | - | 12 |
| සබරගමුව | කෑගල්ල | - | 1 | 7 | - | 1 | - | 08 |
| | රත්නපුරය | - | 1 | 11 | - | - | - | 12 |
| ඌව | බදුල්ල | - | 1 | 7 | - | 1 | - | 09 |
| | මොණරාගල | - | 1 | 7 | - | 1 | - | 08 |
| මධ්‍යම | මහනුවර | - | 1 | 9 | - | 2 | - | 10 |
| | මාතලේ | - | 1 | 5 | 1 | - | - | 06 |
| | නුවරඑළිය | - | 1 | 4 | - | - | - | 05 |
| උතුරු මැද | අනුරාධපුර | - | 1 | 7 | 1 | 1 | - | 8 |
| | පොලොන්නරුව | - | 1 | 2 | 1 | [1] | [1] | 5 |
| | **එකතුව** | **8** | **22** | **181** | | **04** | **1** | **216** |

NVTI - **ජාතික වෘත්තීය පුහුණු ආයතන**
DVTC - **දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන**
VTC - **වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන**
AT - **අනුබද්ධිත**
PC - **බන්ධනාගාර**
Reh - **පුනරුත්ථාපන මධ්‍යස්ථාන**
[ ] - **පුහුණු මධ්‍යස්ථාන ලෙස TVEC ලියාපදිංචිව ඇති මධ්‍යස්ථාන**

## VTA Training Centet Network -2020



## වෘත්තීය පුහුණු පරීක්ෂණ හා ඇගයීම්

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය විසින් පුහුණුවලත් ආධුනිකයින් ඇගයීම් ක්‍රමවේදයන් මගින් ඇගයීම් කර සහතිකපත් ලාභීන් බවට පත්කරනු ලැබේ. මේ සඳහා වාර්ෂිකව රුපියල් මිලියන 5 කට අධික මුදලක් වැයකරනු ලැබේ. ඒ අනුව 2020 වර්ෂයේදී ඇගයීම් සිදුකර නිකුත් කල සහතිකපත් ප්‍රමාණය පහත පරිදි වේ.

| අංක | වර්ගය | නිකුත් කල සහතිකපත් ප්‍රමාණය |
|---|---|---|
| 01 | ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) | 17,243 |
| 02 | ජාතික වෘත්තීය සුදුසුකම් නොවන (Non NVQ) | 962 |
| 03 | පෙරදැනුම ඇගයීම් ක්‍රමය (RPL) | 648 |
| | **එකතුව** | **18,853** |



## වෘත්තීය මාර්ගෝපදේශනය හා උපදේශනය

තරුණ තරුණියන්ගේ රුචිකත්වය හා සුදුසුකම් මත ගැලපෙන වෘත්තීය ක්ෂේත්‍ර තෝරා ගැනිමට මඟ පෙන්වීම ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ තවත් කර්තව්‍යයකි. ඒ සඳහා සුදුසුකම් ලත් නිළධාරී මණ්ඩලයක් විසින් යෞවන යෞවනියන්ගේ රුචිකත්වය හා සුදුසුකම් මත ඔවුනට ගැලපෙන වෘත්තීය ක්ෂේත්‍ර තෝරා ගැනිමට දීපව්‍යාප්තව වෘත්තීය මාර්ගොපදේශන වැඩසටහන් පවත්වනු ලැබේ. 2020 වර්ෂය තුල ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් පහත පරිදි වේ.

| ඉලක්කගත කණ්ඩායම | පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|
| පාසැල් සිසුන් | 153 | 8,232 |
| පාසැල් හැරයන්නන් | 42 | 3,082 |
| පුහුණුවන්නන් | 166 | 8,155 |
| දෙමාපියන් | 135 | 5,976 |
| වෙනත් | 56 | 3,873 |
| **එකතුව** | **552** | **29,318** |



## රැකියාගත කිරීම

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ ලියාපදිංචි කරන ලද දේශීය හා විදේශීය රැකියා ආයතන මඟින් 2020 වසර සඳහා පුහුණු ලාභීන් 2755 දෙනෙකු ශ්‍රම වෙළඳපොල අවශ්‍යතා සපුරාලීමට සෘජුව හා ස්වයං රැකියා තුලින් රැකියා සඳහා යොමු කිරීමට හැකිවිය.

| අංකය | පුහුණු ක්ෂේත්‍රය | රැකියා ගත කල සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|---|
| | | දේශීය | විදේශීය | ස්වයං | එකතුව |
| 01. | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 227 | | 30 | 257 |
| 02. | මෝටර් රථ අලුත්වැඩියාව හා නඩත්තුව | 210 | 1 | 8 | 219 |
| 03. | විදුලි, විද්‍යුත් හා විදුලි සංදේශ | 273 | | 80 | 353 |
| 04. | ශීතකරණ හා වායු සමීකරණ | 67 | | 3 | 70 |
| 05. | ආහාර තාක්ෂණය | 71 | 3 | 3 | 77 |
| 06. | සන්නිවේදනය හා බහුමාධ්‍ය තාක්ෂණය | 411 | 1 | 19 | 431 |
| 07. | හෝටල් හා සංචාරක | 285 | 2 | 0 | 287 |
| 08. | ලෝහ හා ලුහු ඉංජිනේරු | 110 | | 4 | 114 |
| 09. | දැව ආශ්‍රිත | 46 | | 15 | 61 |
| 10. | මැණික් හා ස්වර්ණාභරණ | 3 | 1 | | 04 |
| 11. | මුද්‍රණ හා ඇසුරුම් | 25 | | | 25 |
| 12. | රෙදිපිළි හා ඇඟලුම් | 269 | 1 | 158 | 428 |
| 13. | පුද්ගල හා සමාජ | 311 | 4 | 106 | 421 |
| 14. | කාර්යාල කළමනාකරණය | 8 | | | 08 |
| | **එකතුව** | **2316** | **13** | **426** | **2755** |

## රැකියාගත කිරීම




## රැකියා ස්ථාපනය තුලින් ජාතික ආර්ථිකයට දැක්වු දායකත්වය

| වර්ගය | ස්ථාපනය කළ සංඛ්‍යාව | ජාතික ආර්ථිකයට දැක්වු දායකත්වය (රු. මිලියන) |
|---|---|---|
| දේශීය රැකියා | 2,316 | 881.93 |
| විදේශීය රැකියා | 13 | 18.34 |
| ස්වයං රැකියා | 426 | 150.83 |
| එකතුව | 2,755 | 1051.1 |

(තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ශ්‍රම වෙළඳපොල සඟරාව හා රැකියාගත කළ ආයතනයන්හි දත්ත මත 2020 වර්ෂයේ රැකියාගත කරන ලද පුහුණුලාභීන් සංඛ්‍යාව වසරක කාලයක් සේවය කරනු ලැබූ බවට උපකල්පනය කර ඉපයූ ආදායම දළ වශයෙන් ඇස්තමේන්තු කර සකස් කර ඇත.)

| වර්ෂය | දේශීය | විදේශීය | ස්වයං | එකතුව |
|---|---|---|---|---|
| 2016 | 5,091 | 204 | 757 | 6,052 |
| 2017 | 5,378 | 146 | 1,137 | 6,662 |
| 2018 | 6,542 | 107 | 1,374 | 8,023 |
| 2019 | 3,912 | 47 | 687 | 4,646 |
| 2020 | 2,316 | 13 | 426 | 2,755 |

(ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය මඟින් රැකියාගත කල තොරතුරු පමණි)




## රාජ්‍ය හා පෞද්ගලික ආයතන හා එක්ව සිදුකල වැඩසටහන්

| වැඩසටහන | වැඩසටහන් සංඛ්‍යාව | සහභාගි වූ සංඛ්‍යාව | අනුග්‍රාහක ආයතන |
|---|---|---|---|
| ටයිල් ඇතිරීම | 03 | 123 | ලංකා ටයිල්ස් සමාගම |
| රූපලාවන්‍ය | 04 | 765 | නේචර්ස් බියුටි ක්‍රියේෂන්,ටියාරා මාකටින් සමාගම |
| ඇලුමිනියම් පිරිසැකසුම් | 1 | 40 | ස්විස්ටෙක් ඇලුමිනියම් |
| විදුලි කාර්මික | 6 | 531 | ACL කේබල්ස් |
| **එකතුව** | **14** | **1459** | |



## ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් පැවැත්වීම

තරුණ ව්‍යවසායකයින් දිරිගන්වමින් ඔවුන්ගේ ව්‍යවසායකත්ව හැකියාවන් වැඩි දියුණු කිරීම හා ඔවුන්ට අත හිත දීම ද ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ ප්‍රධාන අරමුණ වේ.

ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන් 12 ක් පවත්වා 237 ක් සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණුව ලබාදීම.

## අභියෝග

- නොමිලේ වෘත්තීය අධ්‍යාපනය සැපයීම ආරම්භයත් සමඟ ඇති වී ඇති ඉල්ලුම සැපයීමට ප්‍රමාණවත් මූල්‍ය හා භෞතික සම්පත් හිඟවීම.
- කර්මාන්ත ක්ෂේත්‍රයේ ඉහළ ශ්‍රම ඉල්ලුමක් ඇති ශිල්පීය මට්ටමේ පාඨමාලාවන්ට තරුණ තරුණියන්ගේ වැඩි නැඹුරුතාවයක් නොමැතිවීම.
- තරුණ තරුණියන් වෘත්තීය පුහුණුව කෙරෙහි ආකර්ෂණය කර ගැනීමට විශාල පරිශ්‍රමයක් දැරීමට සිදුවීම.
- වෘත්තීය පුහුණුව සපයන රාජ්‍ය නොවන සංවිධාන හා අනෙකුත් ආයතන මඟින් සපයන පහසුකම් වැඩිවීම නිසා ඒ අයුරින්ම පහසුකම් සැපයීමට අපහසුවීම මත දැඩි තරඟකාරීත්වයකට මුහුණ දීමට සිදු වීම.
- වෘත්තීය පුහුණුව සපයන පෞද්ගලික අංශයේ ආයතන හා තරඟකාරීව කටයුතු කිරීමට සිදුවීම.
- වෘත්තීය පුහුණුවේ වැදගත්කම පිළිබඳව සමාජය දැනුවත් කිරීමට හා ආකල්ප සංවර්ධනයට පුළුල් ප්‍රචාරාත්මක වැඩසටහන් දියත් කිරීමට සිදුවීම.
- වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන සඳහා යටිතල පහසුකම් සැපයීමට ප්‍රමාණවත් මූල්‍ය පහසුකම් නොමැතිවීම.
- දිවයින පුරා ක්‍රියාත්මක සෑම වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයකටම සමාන මට්ටමේ පහසුකම් සැපයීමට අපොහොසත් වීම.
- සේවා සපයන ආයතනයක් ලෙස රජය විසින් වෙන් කරන ප්‍රාග්ධන හා පුනරාවර්ථන ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම.
- පුහුණු ක්ෂේත්‍ර හා රැකියා ඉල්ලුම අතර ඇති නොගැලපීම අවම කර ගැනීම.
- පුහුණු කටයුතු වල ගුණාත්මක භාවය සංවර්ධනය සඳහා නවීන තාක්ෂණය උපයෝගී කර ගනිමින් පුහුණු කටයුතු කිරීම සඳහා දැනුම, හැකියාව, පළපුරුද්ද ඇති උපදේශකවරුන්ගේ හිඟකම හා ඔවුන්ට ඉහළ මට්ටමේ වැටුපක් ගෙවීමට ඇති අපහසුතාවය.
- ගුණාත්මක පුහුණුවක් ලබා දීම සඳහා අත්‍යවශ උපදේශක කාර්යය මණ්ඩලයේ වැටුප් හා අනෙකුත් පහසුකම් ප්‍රමාණවත් මට්ටමින් ඔවුන්ට නොලැබීම මත සේවය හැරයාමේ නැඹුරුවක් පැවතීම.
- නවීණ තාක්ෂණික පුහුණු ක්‍රමවේදයන් දැනට ක්‍රියාත්මක පාඨමාලා සඳහා අන්තර්ග්‍රහණය කිරීමට සම්පත් ප්‍රමාණවත් නොවීම.

# ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය විගණන හා කළමණාකරණ කමිටුව

## කාර්ය සාධනය 2020

2020 වර්ෂයේ විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් 01ක් පවත්වා ඇති අතර විගණන හා කළමණාකරණ කමිටුවේ සාමාජිකයින්ගේ සංයුතිය පහත පරිදි වේ.

**කමිටු සාමාජිකයින්**

| | |
|---|---|
| ටී.එම්.ජේ.බණ්ඩාර මහතා | කමිටු සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| සමන් ඩී. වඩුගේ මහතා | කමිටු සාමාජික හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |

විගණන හා කළමනාකරණ කමිටුව විසින් 2020 වසරේ දී ගෙන ඇති වැදගත් තීරණ පහත පරිදි වේ.

- පවතින පිළිවෙත් හා පද්ධති පිළිබඳ විගණන වාර්තා මගින් පෙන්වා දී ඇති අඩුපාඩු හා දුර්වලතාවයන් මඟහරවා ගෙන පිළිවෙත් හා පද්ධති ශක්තිමත් කිරීම.
- රජයේ විගණන විමසුම් හා කෙටුම්පත් පිළිතුරු සමාලෝචනය කර පිළිතුරු සැකසීමේ ක්‍රමවේදය විධිමත් කිරීම.
- විගණන සැලසුම් හා විගණන වැඩසටහන සමාලෝචනය කිරීම හා එය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මග පෙන්වීම් ලබා දීම.
- අධිකාරියේ ගිණුම් ප්‍රතිපත්තිය හා අනෙකුත් කාර්යයන් ප්‍රශස්ථ මට්ටමකින් පවත්වා ගැනීමට අවශ්‍ය උපදෙස් ලබා දීම.

## පෙරවදන

## 2020 දෙසැම්බර් 31 න් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශය
## ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

සමාලෝචනයට ලක්වූ වර්ෂය සඳහා ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියට මහා භාණ්ඩාගාරයෙන්, අමාත්‍යාංශයෙන්, ආංශික නිපුණතා සංවර්ධන අංශය සහ වෙනත් ආයතන මගින් රු. 1,815,726,663 ක සම්පූර්ණ මූල්‍ය ප්‍රදානයක් ලබා දී ඇත.

ඊට අමතරව, වෘත්තීය පුහුණු අධිකාරිය විසින් සිය ආදායම් අර්ධකාලීණ පාඨමාලා මගින් උපයාගෙන ඇත. විස්තර පහතින් දක්වා ඇත.

| 1.1 රජයේ ප්‍රදාන | වෙන් කිරීම් (රු.) | ලබා දුන් මුදල (රු.) |
|---|---|---|
| භාණ්ඩාගාර ලැබීම් - පුනරාවර්තන | 1,594,250,000 | 1,562,250,000 |
| භාණ්ඩාගාර ලැබීම් - ප්‍රාග්ධන | 48,400,000 | 48,400,000 |
| ආංශික නිපුණතා සංවර්ධන ව්‍යාපෘති | 323,813,000 | 125,420,738 |
| අමාත්‍යාංශ ප්‍රදාන | 4,159,004 | 4,159,004 |
| ආදායම | 67,821,996 | 67,821,996 |
| වෙනත් ව්‍යාපෘති | 7,674,925 | 7,674,925 |
| **එකතුව** | **2,046,118,925** | **1,815,726,663** |

2020 දෙසැම්බර් 31 න් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශය පහත සඳහන් සංයුක්තයන් සමඟ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.

මූල්‍ය ප්‍රකාශය සමඟ පහත සඳහන් සංරචකයන් අඩංගු වේ.

1. 2020 දෙසැම්බර් 31 ට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය
2. 2020 දෙසැම්බර් 31 න් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය
3. 2020 දෙසැම්බර් 31 න් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය
4. 2020 දෙසැම්බර් 31 න් අවසන් වන වර්ෂය සඳහා ශුද්ධ වත්කම්වල වෙනස්කම් සඳහා ප්‍රකාශය
5. මූල්‍ය ප්‍රකාශය සඳහා සටහන්

ජේ.ඒ.ඩී.එස්. නිෂාමනී
අධ්‍යක්ෂ මුදල් (වැඩ බලන)

චිරංග බස්නායක
සභාපති / ප්‍රධාන විධායක නිලධාරී

**අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් සභාපතිතුමන්ගේ ප්‍රකාශය**

## 2020 දෙසැම්බර් 31 න් අවසන් වන වසර සඳහා මූල්‍ය ප්‍රකාශය
## ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

2020 දෙසැම්බර් 31 න් අවසන් වන වර්ෂය සඳහා ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ මූල්‍ය ප්‍රකාශයන් ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතවලට සහ 1995 අංක 12 දරන ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරී පනත හා 1971 අංක 38 දරන මූල්‍ය පනතේ නිර්දේශයන් සහ ආකාරයන් අනුව සකස් කර ඇත.

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය මගින් අනුමත කර ඇති මූල්‍ය නීති සහ ක්‍රියාපරිපාටීන් අනුගමනය කර ඇති අතර, වත්කම් ආරක්ෂා කිරීම සහ ඵලදායි සහ කාර්යක්ෂම ලෙස ගණුදෙනු කටයුතු සිදු කිරීම තහවුරු කිරීමට පද්ධති හා පාලන හැකිතාක් දුරට ප්‍රායෝගික ලෙස පවත්වාගෙන ඇත. 2020 දෙසැම්බර් 31 න් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශයන් සතුටුදායක අන්දමින් සකස් කර ඇති අතර, ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ මූල්‍ය තත්වය සත්‍ය සහ සාධාරණ තත්වයක් පෙන්නුම් කරන බව මාගේ හැඟීමයි.



සභාපති / ප්‍රධාන විධායක නිලධාරී
අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවට
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය



මණ්ඩලයේ අධ්‍යක්ෂ



මණ්ඩලයේ අධ්‍යක්ෂ

## ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය
## 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

| | සටහන | 2020 (රු) | | 2019 (රු)<br>නැවත සදහන් කළ පරිදි | |
|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | |
| ජංගම නොවන වත්කම් | | | | | |
| දේපල, පිරියත සහ උපකරණ | 2 | 6,279,850,791.18 | | 6,431,006,615.55 | |
| ප්‍රගතියේ පවතින ප්‍රාග්ධන වැඩ | 3 | 24,408,156.27 | | 38,194,328.94 | |
| වෙනත් මූල්‍ය වත්කම් | | | | | |
| පුහුණු උපකරණ ක්ෂය වීම් සඳහා ප්‍රතිපාදන | | 442,348,590.68 |
| **ප්‍රගතියේ පවතින ප්‍රාග්ධන වැඩ** | | |
| ප්‍රගතියේ පවතින වැඩ - ගොඩනැගිලි ව්‍යුහයන් | 24,408,156.27 | |
| ආයෝජන | | |
| ස්ථාවර තැන්පතු | 40,000,000.00 | |
| **ඉන්වෙන්ටරි** | | |
| පුහුණු ද්‍රව්‍ය | 24,743,377.29 | |
| ලිපි ද්‍රව්‍ය | 5,645,499.64 | |
| වෙනත් පාරිභෝජන ද්‍රව්‍ය | 951,474.00 | |
| **වෙනත් ලැබීම්** | | |
| වැඩසටහන් සඳහා අත්තිකාරම් | 25,000.00 | |
| ඉඩම් සඳහා අත්තිකාරම් | 43,342,340.00 | |
| **ඉදිකිරීම් සඳහා ජංගම අත්තිකාරම්** | | |
| අනිවාර්ය කටයුතු සඳහා තැන්පතු | 3,227,736.75 | |
| තැන්පතු | 1,662,250.00 | |
| යෞවන කටයුතු සහ නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය | 3,548,334.94 | |
| වාහන සේවා ආදායම් ලැබීම් | 113,035.00 | |
| පාඨමාලා ගාස්තු ලැබීම් | 18,945,180.00 | |
| වැටුප් ලැබීම් | 1,255,462.71 | |
| ආදායම් හිඟතාවයන් | 11,732.00 | |
| රජයේ ආයතනයන් | 1,964,635.71 | |
| වෙළඳ සහ වෙනත් ලැබීම් | 1,271,700.46 | |
| පෙර ගෙවීම් | | |
| බොල් ණය සඳහා ප්‍රතිපාදන | | 5,512,970.65 |

| විස්තරය | හර | බැර |
|---|---|---|
| සේවක ණය | | |
| ආපදා ණය | 45,377,546.96 | |
| උත්සව අත්තිකාරම් | 283,750.00 | |
| **<u>මුදල් සහ මුදල් සමාන දෑ</u>** | | |
| රන් කාසි | 193,025.00 | |
| **<u>බැංකු ගිණුම්</u>** | | |
| අම්පාර | 913,475.10 | |
| අනුරාධපුරය | 877,485.94 | |
| බදුල්ල | 1,018,048.14 | |
| මඩකලපුව | 1,385,540.71 | |
| කොළඹ | 723,612.64 | |
| ගාල්ල | 766,602.85 | |
| ගම්පහ | 738,436.01 | |
| හම්බන්තොට | 713,440.31 | |
| ප්‍රධාන කාර්යාලය | 92,060,019.74 | |
| යාපනය | 1,010,248.57 | |
| කළුතර | 422,417.50 | |
| මහනුවර | 769,999.65 | |
| කෑගල්ල | 995,950.64 | |
| කිලිනොච්චිය | 616,855.22 | |
| කුරුණෑගල | 225,125.80 | |
| මාතලේ | 81,807.39 | |
| මාතර | 753,320.18 | |
| මොනරාගල | 1,324,228.27 | |
| මුලතිව් | 1,163,668.12 | |
| නුවර එළිය | 2,029,453.78 | |
| NVTI - බද්දේගම | 635,119.02 | |
| NVTI - මීරිජ්ජවිල | 1,145,641.22 | |
| NVTI - නාරාහේන්පිට | 897,148.17 | |
| NVTI - නියාගම | 819,844.61 | |
| NVTI - ඔරුගොඩවත්ත | 1,085,697.10 | |
| NVTI - රත්මලාන | 853,915.61 | |
| NVTI - තලල්ල | 1,552,918.07 | |
| පොළොන්නරුව | 604,213.75 | |
| පුත්තලම | 99,163.06 | |
| රත්නපුර | 757,577.35 | |
| ත්‍රිකුණාමලය | 117,645.17 | |
| ඌව පළාත | 109,873.95 | |
| බස්නාහිර පළාත | 269,099.38 | |
| වවුනියාව | 905,173.43 | |
| සබරගමු පළාත | 220,544.00 | |
| මධ්‍යම පළාත | 290,629.65 | |

| විස්තරය | හර | බැර |
|---|---|---|
| දකුණු පළාත | 364,862.56 | |
| වයඹ පළාත | 67,043.54 | |
| උතුරු මැද පළාත | 55,367.04 | |
| අතැති මුදල් | 37,254.00 | |
| **අතැති චෙක්පත්** | | |
| රජයේ ප්‍රාග්ධන ප්‍රදාන | | 14,291,743.97 |
| රජයේ ප්‍රදාන (භාණ්ඩාගාර) - පුනරාවර්තන | | 1,562,250,000.00 |
| විලම්භිත ආදායම් ප්‍රදාන - පුනරාවර්තන | | 519,143,699.02 |
| **වෙන් කිරීම් සහ අතිරික්ත** | | |
| විලම්භිත ආදායම් ප්‍රදාන | | 4,144,150,968.72 |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | | 587,431,040.50 |
| ප්‍රත්‍යාගණනය කළ අතිරික්තය | | 2,653,836,821.05 |
| **ප්‍රාග්ධන නොවන වගකීම්** | | |
| BOC- ෆිනෑන්ස් කුලී වගකීම | | 37,225,900.00 |
| අවිනිශ්චිතභාවයේ පොලී | 11,825,900.00 | |
| **ගෙවීම්** | | |
| දේශක ගාස්තු ගෙවීම් | | 2,222,963.00 |
| පාඨමාලා ගාස්තු ගෙවීම් | | 317,580.00 |
| තැන්පතු | | 60,000.00 |
| E.P.F. ගෙවීම් | | 17,130,486.10 |
| E.T.F. ගෙවීම් | | 2,569,572.81 |
| දේශක ගාස්තු ගෙවීම් | | 8,297,688.50 |
| වෙනත් ගෙවීම් | | 7,779,308.67 |
| ව්‍යාපෘති ආධාර ගෙවීම් | | 2,806,065.20 |
| යෞවන කටයුතු සහ නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය - 13 වසර | | 43,354,501.46 |
| අත්තිකාරම් වශයෙන් ලැබීම් | | 1,781,400.00 |
| ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු | | 2,792,642.71 |
| රඳවාගත් මුදල් | | 19,905,181.57 |
| වැටුප් ගෙවීම් | | 945,078.73 |
| කාර්ය මණ්ඩල දිරි දීමනා ගෙවීම් | | 157,500.00 |
| ශිෂ්‍ය රක්ෂණ ගෙවීම් | | 37,883,500.00 |
| වෙළඳ ණය ගැතියන් | | 812,970.60 |
| W & OP ගෙවීම් | | 45,342.00 |
| **සමුච්චිත වියදම්** | | |
| සමුච්චිත වෘත්තීය මාර්ගෝපදේශනය | | 38,077.00 |
| සමුච්චිත විදුලි බලය | | 1,961,756.26 |
| සමුච්චිත විභාග සහ ඇගයීම් | | 718,556.00 |
| සමුච්චිත ඉන්ධන සහ ලිහිසුස්ම් | | 19,000.00 |
| සමුච්චිත සනීපාරක්ෂක සේවා | | 1,256,671.00 |
| සමුච්චිත නඩත්තු | | 1,194,419.39 |
| සමුච්චිත පුවත්පත් සහ වාර සඟරා | | 11,710.00 |
| සමුච්චිත සේවාස්ථ පුහුණුව | | 296,500.00 |

| විස්තරය | හර | බැර |
|---|---|---|
| සමුච්චිත අතිකාල සහ නිවාඩු දින ගෙවීම් | | 1,759,267.40 |
| සමුච්චිත අර්ධ කාලීණ වියදම් | | 11,951,941.95 |
| සමුච්චිත ප්‍රවර්ධන වියදම් | | 566,522.00 |
| සමුච්චිත කුලී, වරිපනම් සහ බදු | | 457,500.00 |
| සමුච්චිත වාර ප්‍රවේශ පත්‍ර ගාස්තු | | 668,301.39 |
| සමුච්චිත ආරක්ෂණ ගාස්තු | | 4,253,258.16 |
| සමුච්චිත වැටුප් දීමනා | | 369,750.20 |
| සමුච්චිත දුරකථන ගාස්තු | | 1,373,551.30 |
| සමුච්චිත දුරකථන ගාස්තු | | 55,960.00 |
| සමුච්චිත ප්‍රවාහනය | | 332,561.21 |
| සමුච්චිත ජලය | | 620,891.86 |
| වාහන් කුලී ගාස්තු | | 108,500.00 |
| **වෙනත් ආදායම්** | | |
| වෙන්දේසි ආදායම | | 357,255.25 |
| පාඨමාලා ගාස්තු | | 1,972,000.00 |
| ආපනශාලා ආදායම | | 309,520.00 |
| **සමාගම් ලියාපදිංචිය** | | |
| දෛනික කටයුතු | | 3,376,050.00 |
| ව්‍යවසායකත්ව වැඩසටහන් | | 86,500.00 |
| දඩ | | 176,060.77 |
| ශාලා ආදායම | | 448,325.00 |
| නේවාසිකාගාර ගාස්තු | | 554,185.00 |
| සංචාරක බංගලාව - කතරගම | | 226,880.00 |
| ණය වාරික | | 1,631,896.76 |
| විවිධ ආදායම් | | 1,580,283.83 |
| ආපසු නොගෙවන ලද ටෙන්ඩර් තැන්පතු | | 140,000.00 |
| වාර්තා පොත | | 4,967,300.00 |
| ලියාපදිංචි ගාස්තු | | 11,772,000.00 |
| නිමැවුම් භාණ්ඩ විකිණුම් | | 247,187.75 |
| ඉතිරුම් ගිණුම් පොළී | | 4,051,456.99 |
| සැපයුම් ලියාපදිංචිය | | 603,800.00 |
| **ඉංග්‍රීසි පොත් ආදායම** | | |
| විභාග ගාස්තු | | 11,548,900.00 |
| **නිෂ්පාදන ඒකක ආදායම** | | |
| ඉපැයීම් 10% | | 2,141,723.16 |
| අර්ධ කාලීණ පාඨමාලා | | 16,897,486.42 |
| මුද්‍රණ පාසල නාරාහේන්පිට | | 65,043.10 |
| පෙර ඉගැනුම් හඳුනා ගැනීම (RPL) | | 3,332,908.60 |
| ක්ෂේත්‍ර පරීක්ෂණ | | 7,774.00 |
| තලල්ල ආපන ශාලාව | | 39,281.91 |
| **වාහන සේවා කිරීම** | | |
| වෙනත් නිෂ්පාදන ඒකකය | | 1,288,177.63 |

| විස්තරය | හර | බැර |
|---|---|---|
| **<u>විශේෂ ව්‍යාපෘති සඳහා ආධාර</u>** | | |
| SSDP සඳහා ආධාර | | 87,778,342.51 |
| මුස්ලිම් ආධාර සඳහා ආධාර | | 311,000.00 |
| අමාත්‍යාංශය සඳහා ආධාර - වසර 13 | | 74,945.00 |
| මුල් ළමා විය සංවර්ධන සඳහා ආධාර | | 305,311.00 |
| මහවැලි අධිකාරිය සඳහා ආධාර | | 2,238,000.00 |
| සේවක වියදම | | |
| E.P.F. වියදම් | 124,417,717.11 | |
| E.T.F. වියදම් | 31,104,802.06 | |
| E.T.F. අධිභාරය | | |
| වෙනත් දීමනා (කාර්ය මණ්ඩල වියදම) | 181,639,119.15 | |
| වැටුප් සහ අතිකාල | 872,709,389.81 | |
| කාර්ය මණ්ඩල පාරිතෝෂිකය | 92,938,811.02 | |
| පාරිතෝෂිකය සඳහා අධිභාරය | | |
| **<u>ගමනාගමනය</u>** | | |
| **<u>නවාතැන් වියදම්</u>** | 120,900.00 | |
| ගමනා ගමනය - දේශීය | 4,227,749.96 | |
| ගමනාගමනය - විදේශීය | | |
| භාණ්ඩ සමීක්ෂණ වියදම් | 3,783,722.00 | |
| **<u>සැපයුම් සහ වෙනත් පරිභෝජන ද්‍රව්‍ය</u>** | | |
| ඉන්ධන සහ ලිහිස්සුම් ගාස්තු | 14,496,956.75 | |
| වෙනත් සැපයුම් | 1,921,252.54 | |
| ලිපි ද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා | 6,122,496.71 | |
| මුද්‍රිත ද්‍රව්‍ය | 481,822.20 | |
| **<u>නඩත්තුව</u>** | | |
| ගොඩනැගිලි නඩත්තු කිරීම | 8,201,959.24 | |
| දේපල සහ පිරියත නඩත්තුව | 6,771,174.27 | |
| වාහන නඩත්තු කිරීම | 7,586,827.36 | |
| කාර්යාල උපකරණ නඩත්තුව | 1,276,494.34 | |
| **<u>ගිවිසුම්ගත සේවා</u>** | | |
| වෙළඳ දැන්වීම් | 1,338,259.20 | |
| විගණන ගාස්තු | 1,100,000.00 | |
| විදුලි බල ගාස්තු | 44,072,200.47 | |
| කුලී අය කිරීම් | 2,338,005.00 | |
| රක්ෂණය | 3,310,186.38 | |
| සනීපාරක්ෂක සේවා | 16,614,978.78 | |
| පුවත්පත් සහ වාර ප්‍රකාශන | 1,078,765.40 | |
| තැපැල් ගාස්තු | 872,459.34 | |
| කුලී, වරිපනම් සහ බදු | 8,773,939.74 | |
| ආරක්ෂක ගාස්තු | 46,077,600.76 | |
| කාර්ය මණ්ඩල සුභසාධනය සහ වෙනත් | 396,345.00 | |
| දුරකථන ගාස්තු | 20,810,585.68 | |

| විස්තරය | හර | බැර |
|---|---|---|
| ප්‍රවාහනය | 1,223,893.00 | |
| ජල බිල්පත් | 9,256,673.59 | |
| උපදෙස් සහ වෘත්තීය ගාස්තු | 598,965.50 | |
| **රැකියාගත කිරීම, පර්යේෂණ සහ ව්‍යවසායකත්වය** | | |
| විෂයමාලා සංවර්ධනය | 80,830.00 | |
| සේවාස්ථ පුහුණුව සහ අධීක්ෂණය | 4,753,750.00 | |
| ව්‍යවසායකත්ව වැඩසටහන් | 75,493.00 | |
| රැකියාගත කිරීම | 254,534.00 | |
| පර්යේෂණ සහ අන්වේෂ්‍ය අධ්‍යයන | 966,325.33 | |
| පුද්ගලික සහ රාජ්‍ය හවුල්කාරිත්වය | 211,063.83 | |
| **වෙනත් මෙහෙයුම් වියදම්** | | |
| විභාග සහ ඇගයීම් | 33,798,801.75 | |
| ප්‍රසාද දීමනා | 555,200.00 | |
| නීති ගාස්තු | 739,820.00 | |
| විවිධ වියදම් | 4,988,281.77 | |
| තත්ව කළමනාකරණය සහ ප්‍රතීතනය | 1,519,793.08 | |
| වාර ප්‍රවේශ පත්‍ර | 2,946,599.53 | |
| විශේෂ පුහුණු වැඩසටහන | 94,217.85 | |
| වැටුප් දීමනා | 8,799,000.00 | |
| ආවුද සහ පර්යේෂණ ද්‍රව්‍ය | 271,924.00 | |
| පුහුණුව අධීක්ෂණය | 1,700.00 | |
| **විශේෂ ව්‍යාපෘති සඳහා වියදම** | | |
| **ලෝක නිපුණතා දිනය සඳහා වියදම** | | |
| SSDP සඳහා වියදම | 87,778,342.51 | |
| මුස්ලිම් ආධාර සඳහා වියදම | 311,000.00 | |
| අමාත්‍යාංශය සඳහා වියදම - වසර 13 | 74,945.00 | |
| මුල් ළමා විය සංවර්ධන සඳහා වියදම | 305,311.00 | |
| මහවැලි අධිකාරිය සඳහා වියදම | 2,238,000.00 | |
| **මූල්‍ය වියදම** | | |
| බැංකු අය කිරීම් | 108,617.80 | |
| පුහුණු ද්‍රව්‍ය | 70,166,921.06 | |
| කාර්ය මණ්ඩල පුහුණුව - ධාරිතා සංවර්ධනය | 1,823,212.43 | |
| ප්‍රවර්ධන වියදම් | 10,258,765.57 | |
| වෘත්තීය මාර්ගෝපදේශනය | 1,385,539.50 | |
| ක්ෂය වීම් | 519,143,699.02 | |
| මූල්‍ය ලීසිං සඳහා පොලී | 2,365,180.00 | |
| කල්බදු ක්‍රමය යටතේ වාහන බද්දට / කුලියට දීම | 4,276,540.80 | |
| ලාභ /පාඩු ගිණුම් | 926,291,814.55 | |
| පෙර වසරේ ගැලපීම් | 28,620,544.17 | |
| අනුමත හැරයාම් | 254,000.00 | |
| **මුළු එකතුව** | **12,080,010,940.79** | **12,080,010,940.79** |

# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } VOT/D/VTA/1/20/37

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2022 මාර්තු 30 දින

සභාපති

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

**ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කල මතය**

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.



අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

**1.2 තත්ත්වාගණනය කල මතය සඳහා පදනම**

(අ) ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ සම්පූර්ණ (100%) කොටස් අයිතිය සහිතව 2013 දෙසැම්බර් 18 දින වී.ටී.ඒ. හෝල්ඩින්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් නමින් 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සමාගමක් ලියාපදිංචි කර තිබුණි. එහෙත් 2013 දෙසැම්බර් 18 දින සිට 2020 දෙසැම්බර් 31 දින දක්වාම අදාල සමාගමේ මූල්‍ය ප්‍රකාශන සමග ඒකාබද්ධ කළ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර එම මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 හි 48 වගන්තිය අනුව ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත මඟින් අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටෙක හැර ආදායම් වියදම් හිලව් නොකල යුතු වුවත් ආදායම් විෂයන් 06 කට අදාලව රු. 44,150,305ක ආදායමින් රු. 23,847,123 ක වියදම් හිලව් කර ශුද්ධ අගය ලෙස රු. 20,303,182ක් මූල්‍ය කාර්යයසාධන ප්‍රකාශනයේ දක්වා තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 14 වගන්තිය අනුව වත්කම් අයිතමය හා ආශ්‍රිත අනාගත ප්‍රතිලාභ හෝ සේවා ශක්‍යතාවන් අස්ථිත්වය වෙත ගලාඒමේ හව්‍යතාවයක් ඇති විට හා වත්කමේ පිරිවැය හෝ සාධාරණ අගය විශ්වාසවන්ත ලෙස මැනිය හැකි විට අස්ථිත්වයේ වත්කම් ලෙස හඳුනාගෙන ගිණුම් තැබිය යුතුය. එහෙත් අධිකාරිය විසින් 2019 ජූනි සිට පාඨමාලා පවත්වාගෙන යනු ලබන පිරිවැය රු. 1,833,749,343 ක් වූ ඔරුගොඩවත්ත ජාතික මධ්‍යස්ථානයේ ගොඩනැගිල්ල හා අධිකාරියේ පාඨමාලා පවත්වාගෙන යනු ලබන පවරාගෙන නොතිබුණු ඉඩම් 28 ක වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 47 ඡේදය ප්‍රකාරව දේපල පිරියත හා උපකරණ අයිතමවල සාධාරණ වටිනාකම් සැලකියයුතු තරම් වෙනස් වී ඇත්නම් එම වත්කම් ප්‍රත්‍යාගණනය කලයුතු වුවත් අධිකාරිය සතු පිරිවැය රු. 6,172,723,341ක්වූ ඉඩම් හා ගොඩනැගිලි 2008 වර්ෂයෙන් පසු ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. මෙම නිසා එම වත්කම්වල සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශන වලින් පෙන්නුම් නොකෙරුණි.

(ඉ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 12 අනුව සින්නක්කර ඉඩම් හා බදු ඉඩම්, මූල්‍ය ප්‍රකාශනවල වෙන්කර දක්වා නොතිබූ අතර අධිකාරිය විසින් එකතුව රු. 9,842,565 ක් වූ කල්බදු ඉඩම් 05 ක් සම්බන්ධයෙන් යොමුගත ප්‍රමිතය පරිදි ක්‍රමක්ෂය කර නොතිබුණි.

2

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

(ඊ) 2017 දෙසැම්බර් 20 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය වෙත ලබා දුන් ඉඩම වෙනුවට ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියට ලැබී තිබුණු අක්කර 02 රූඩ් 03 පර්චස් 38.38 ක්වූ අත්තිඩිය ප්‍රදේශයේ "අත්තිඩිය වෙල්යාය හා හුණුකුඹුර" නැමති ඉඩම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(උ) 2018 දෙසැම්බර් 31 දිනට මෝටර් වාහන පංතිය යටතේ වත්කම් ලෙස හඳුනාගෙන තිබුණු ශුද්ධ අගය රු.4,496,902 ක් වූ මෝටර් රථ 24 ක් එම වර්ෂයේදී සිදුකර තිබුණු ප්‍රත්‍යාගණනයේදී අත්හැරී තිබුණද එය නිවැරදි කිරීමට සමාලෝචිත වර්ෂය තුළදී ද කටයුතු කර නොතිබුණි.

(ඌ) ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරිය හා මොබිටෙල් ආයතනය අතර දුරකථන සිම්පත් ලබාගැනීම සම්බන්ධයෙන් ඇති කරගෙන තිබුණු ගිවිසුමකට අනුව 2019/ 2020 වර්ෂයට අදාලව 2020 අගෝස්තු 12 දින ලැබී තිබුණු රු. 1,300,000 ක මුදල වෙනත් ආදායම් යටතේ ගිණුම්ගත කිරීමකින් තොරව එම මුදල අරමුණට පටහැනි කාර්යයක් වෙනුවෙන් වැය කර තිබීම නිසා වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 අධිකාරියේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු**

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අධිකාරියේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත්

ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

### 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරියේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

5

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මෙම වාර්තාවේ තත්ත්වාගණනය කල මතය සඳහා පදනම කොටසේ දක්වා ඇති නිරීක්ෂණ වලට යටත්ව විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මතය සඳහා පදනම කොටසේ දක්වා ඇති අංක (ඈ), (ඉ), (ඊ) හා (උ) ඡේද හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අධිකාරිය සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

6

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

| නීතිරීති / විධානයට යොමුව | නිරීක්ෂණ |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| i. මුදල් රෙගුලාසි 04 වන උපලේඛනයේ 288 පොදු ආකෘතිය | ස්ථාවර වත්කම් ලේඛනයක් සියලුම ආයතන විසින් පවත්වාගත යුතු වුවත්, අධිකාරියේ 2020 දෙසැම්බර් 31 දිනට රු. 6,279,859,791 ක දේපළ පිරියත උපකරණ පැවතියද ඒ සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන නොතිබුණි. |
| ii. මුදල් රෙගුලාසි 1646 | ධාවනය කරනු ලබන සංචිත වාහනවල ධාවන සටහන් ඊළඟ මාසයේ 15 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවද සංචිත වාහන 123 කට අදාල 2019 ජනවාරි මාසයේ සිට 2021 දෙසැම්බර් දක්වා අදාල දෛනික ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. ඒ හේතුවෙන් අදාල කාලපරිච්ඡේදය තුල වැයකර තිබුණු රු. 28,280,105 ක ඉන්ධන පරීක්ෂා කල නොහැකි විය. |
| (ආ) චක්‍රලේඛ | |
| i. 2015 ජුලි 14 දිනැති අංක 3/ 2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | චක්‍රලේඛයේ 371(2) ආ ඡේදය අනුව තත්කාර්ය අතුරු අග්‍රිම ලෙස යම් විශේෂිත කාර්යයක් සඳහා මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට පමණක් එක් අවස්ථාවකදී රු. 100,000 ක උපරිමයක් දක්වා පමණක් අතුරු අග්‍රිම ලබාදිය හැකි වුවත් ඊට පටහැනිව දිස්ත්‍රික් කාර්යාල හා ප්‍රධාන කාර්යාලයේ අවස්ථා 10 කදී රු. 107,500 ක සිට 300,000 දක්වා අතුරු අග්‍රිම ලබාදී තිබුණි. |
| ii. 2020 ජනවාරි 27 දිනැති අංක PED/ 2020 දරන චක්‍රලේ භාණ්ඩාගාර ලේකම්ගේ චක්‍රලේඛය | (ඞ.) යොමුගත චක්‍රලේඛය අනුව නව සභාපතිවරුන් පත්කිරීමේදී කිසිදු නව බඳවාගැනීමක් සිදු නොකල යුතු බව දන්වා තිබියදී අධිකාරියේ අනුමත කාර්යමණ්ඩලය තුල නොමැති උපදේශක තනතුරු දෙකක් |

7

සඳහා බඳවාගැනීම් සිදුකර වර්ෂය තුල දීමනා හා ඉන්ධන දීමනා ලෙස එකතුව රු. 1,749,872 ක් ගෙවීම් කර තිබුණි.

(b.) චක්‍රලේඛයේ විධිවිධානයන්ට අමතරව ආයතනයේ සභාපතිවරුන් විසින් කිසිදු අමතර දීමනාවක් හෝ මූල්‍යාම ප්‍රතිලාභයක් ලබා නොගත යුතු බව අවධාරණය කර තිබියදී ඊට පටහැනි ලෙස අමතර ඉන්ධන දීමනා ලෙස එකතුව රු. 446,673 ක් ද බාහිර ගමන් බිමන් යාම සඳහාත් හෝටල්වල නවාතැන් ගාස්තු හා ආහාර සඳහා එකතුව රු. 435,982 ක් සභාපති වෙත ගෙවීම් කර තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ වලට යටත්ව අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) සමාලෝචිත වර්ෂයට අදාල ආරක්ෂක සේවාව ලබා ගැනිම සඳහා සේවා සැපයුම්කරුවකු තෝරා ගැනීම වෙනුවෙන් සිදු කරන ලද ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශ නොසලකා දෙවන අවම මිල ඉදිරිපත් කල ආරක්ෂක සේවා සපයන සමාගමක් වෙත කොන්ත්‍රාත්තුව පිරිනැමීමට දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව තීරණය කිරිම හේතුවෙන් අධිකාරියට සමාලෝචිත වර්ෂයේදී රු. 2,984,572 ක පාඩුවක් සිදු වී තිබුණි.

(ආ) ආංශික නිපුණතා සංවර්ධන අරමුදල් යටතේ 2019 වර්ෂයේදී ඉදිකරන ලද කෑගල්ල දිස්ත්‍රික් මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාල දෝෂ සහිත ඉංජිනේරු ඇස්තමේන්තුවක් පදනම් කරගෙන ඇගයීම් කටයුතු සිදු කිරීම හා තුලනාත්මක නොවන ලංසු ඉදිරිපත් කරන ලද ලංසුකරුවෙකු තෝරාගැනීම නිසා දෙවන අවම මිල ඉදිරිපත් කරන ලද ලංසුකරු හා සැසදීමේදී අධිකාරියට රු. 3,073,038 ක පාඩුවක් සිදු වී තිබුණි.

එසේම කොන්ත්‍රාත්තුව ඉටු කිරිමට අදාල බිල්පත්වලට අදාලව විගණනය විසින් 2021 දෙසැම්බර් 01වන දින භෞතිකව මිනුම් ගැනිමේදී රු. 4,857,017 ක වැඩිපුර ගෙවා තිබූ බව නිරික්ෂණය විය.

2.3 වෙනත් කරුණු

(අ) 2006 වර්ෂයේ සිට 2015 මැයි මාසය දක්වා සේවක භාරකාර අරමුදල් දායකය ගණනය කිරිමේදි ජිවන වියදම් දිමනාව සැලකිල්ලට නොගැනිම හේතුවෙන් 2019 වර්ෂයේදි ගෙවිමට සිදු වි තිබුණු රු. 7,898,073 ක අධිභාර මුදල් අදාල පාර්ෂවයන්ගෙන් අයකර ගැනිමට පියවර ගෙන නොතිබුණි.

(ආ) අධිකාරිය යටතේ පවතින ඕරුගොඩවත්ත කොරියන් ටෙක් ආයතනය වෙත කොළඹ වෘත්තිය පුහුණු මධ්‍යස්ථානය හා ගම්පහ කාර්මික විද්‍යාලය ඉදිකිරිමේ කොරියානු ණය ව්‍යාපෘතියෙන් 2019 වර්ෂයේදි ලබාදි තිබුණු එකතුව රු. 15,743,838 ක උපකරණ 157 ක් කිසිදු ප්‍රයෝජනයකින් තොරව නිෂ්කාර්යව පැවතුණු අතර එකතුව රු. 1,784,794 ක් වටිනා උපකරණ 07 ක් අක්‍රිය වි පැවතුණි. එසේම එම ආයතනයට වෛද්‍ය හෝ හෙද තනතුරු අනුමත වි නොතිබියදී රු. 3,500,000 ක වටිනාකමැති වෛද්‍යවරුන් විසින් භාවිතයට ගනු ලබන වෛද්‍ය උපකරණ හා ඖෂධ ලබාදි තිබු අතර එම ඖෂධ වර්ග භාවිතයකින් තොරව කල් ඉකුත් වි තිබුණි.

(ඇ) අධිකාරියේ මෙහෙවර 'වෘත්තිය පුහුණු හා අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි නවින ක්‍රමවේදයක් හා තාක්ෂණයක් මගින් පුද්ගලයන් තුල නිපුණත්වයන් සංවර්ධනය කරමින් ගෝලිය පුහුණු ශ්‍රම ඉල්ලුම සපුරාලිම පිණිස පහසුකම් සැලසිම' විය. එහෙත් නියැදියක් ලෙස ගාල්ල දිස්ත්‍රික්කයේ 2016 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා පුහුණු පාඨමාලා පැවැත්විම සම්බන්ධයෙන් පරික්ෂා කිරිමේදි, මධ්‍යස්ථාන 09 ක පාඨමාලා 13 කට අදාලව පාඨමාලා අවසන් කල ආධුනිකයින් 250 දෙනෙකු සඳහා විගණිත දිනය වූ 2020 නොවැම්බර් 24 දින දක්වාම අවසාන ඇගයිම් පවත්වා නොතිබුණි. එසේම පාඨමාලා සම්පූර්ණ කල ආධුනිකයින් අවසාන ඇගයිම් සඳහා සහභාගී නොවිමේ ප්‍රතිශතය සියයට 30 සිට සියයට 40 දක්වා පැවතුණි. මෙම කරුණු සම්බන්ධයෙන් අධිකාරිය විසින් අවධානය යොමුකර සමාජ හා ආර්ථික වශයෙන් වඩාත් කාර්යක්ෂම හා ඵලදායි අයුරින් කටයුතු කර නොතිබුණි.

9

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ඇ) ප්‍රතිපාදන සලසා ඇති වියදම් සඳහා පමණක් භාණ්ඩාගාර ප්‍රතිපාදන වියදම් කල යුතු බව අවධාරණය කර තිබියදී හා නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ 2020 සැප්තැම්බර් 08 දිනැති ලිපිය අනුව ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ 25 සංවත්සර සැමරුම් උත්සවය සඳහා කිසිදු රජයේ මුදලක් වැය නොකල යුතු බව දක්වා තිබියදී ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව ලබාගත් භාණ්ඩ හා සේවා වෙනුවෙන් භාණ්ඩාගාර ප්‍රතිපාදන මුදල් රු. 2,296,885 ක් හා අධිකාරියේ ආදායම් ලෙස ගිණුම්ගත කලයුතු රු. 1,300,000 ක් වැයකර තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

10

**ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ විගණන පනතේ 12වන වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාවේ පිළිතුරු වාර්තාව**

1.2

(අ) මෙම සමාගමේ කොටස් කිසිවක් වෘත්තීය පුහුණු අධිකාරිය සතුව පැවති බවට ලිඛිත ලේඛණ හෝ වාර්ෂික ගිණුම් වල සඳහන් වී නොමැත.

(ආ) මෙම ආදායම් සහ වියදම් වලට අදාල ලෙජර් ගිණුම් වෙන වෙනම පවත්වා ගෙන යන අතර විගණනය විසින් පෙන්වා දී ඇති ආකාරයට අවසන් ගිණුම් ප්‍රකාශණවල මෙහෙයුම් ප්‍රකාශනයෙහි සහ ඊට අදාල සටහන් වල වෙන් වෙන් වශයෙන් කටයුතු කිරීමට 2022 වර්ෂයේ කටයුතු කරනු ඇත.

(ඇ) ඔරුගොඩවත්ත ජාතික මධ්‍යස්ථානයේ ගොඩනැගිල්ලෙහි වටිනාකම රු.1,833,749,343/= මුදල 2021 වර්ෂයේ ගිණුම්ගත කිරීමට කටයුතු කර ඇත.

(ඈ) ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය සඳහා පවරන ලද හා මිලදී ගන්නා ලද ඉඩම් 29ක් සම්බන්ධයෙන් වටිනාකම් එකවර තක්සේරු කරන ලෙස ඉල්ලා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත තොරතුරු ඉදිරිපත් කර ඇත. ඒ අනුව ඊට ප්‍රතිචාර දක්වමින් 2022.06.21 වන විට තක්සේරු දෙපාර්තුමේන්තුව විසින් ඉඩම් 17ක් සම්බන්ධයෙන් තක්සේරු  වාර්තා ලබා දී ඇත.

(ඉ) මෙම ඉඩම් වලින් යටියන්තොට පමණක් කල්බදු ඉඩමක් වන අතර 2022 වර්ෂයේ ගිණුම් වලට ගැලපීම් කිරීමට කටයුතු කරමි.

(ඊ) මෙහි සඳහන් අක්කර 02 රූඩ් 03 පර්චස් 38.38 ඉඩම නිදහස් දීමනා පත්‍රයකින් වෘත්තීය පුහුණු අධිකාරිය වෙත ලබා දීමට 2021.12.15 දිනැති ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ ලිපිය මඟින් දන්වා ඇති අතර පවරා ගත් වහාම ගිණුම්ගත කර මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ.

(උ) මෙම වාහන 24 පුහුණු උපකරණ ලෙස ප්‍රයෝජනයට ගැනීමට තාක්ෂණ කමිටුවක් මඟින් නිර්දේශ කර ඇති බැවින් විධිමත් පටිපාටි අනුගමනය කර පුහුණු උපකරණ ලෙස ප්‍රයොජනයට ගැනීමට කටයුතු කරමින් පවතී.

( ඌ) මේ සම්බන්ධව අභ්‍යන්තර විගණන පරීක්ෂණයක් සිදු කර 2022.06.21 දින වාර්තාව ලැබී ඇත. ඒ අනුව ඉදිරි කටයුතු සිදු කිරීමට අපේක්ෂා කරමි.

2.2.2

(අ)

1 ස්ථාවර වත්කම් ලේඛණය සැකසීම සඳහා සකස් කරන ලද මෘදුකාංගයෙන් අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීම සඳහා යාවත්කාලීන කිරීම සිදු කළ යුතුය. එම යාවත්කාලීන කිරීමේ කටයුතු සිදු කරමින් පවතී.

11 දැනට ධාවනය වන සියළුම වාහන වල ධාවන සටහන් මේ වන විට ප්‍රවාහන අංශය වෙත ලැබී ඇති අතර රටේ පවතින තත්වය මත කාර්යාල වසා තැබීම , සීමිත කාර්ය මණ්ඩලයක් කැඳවීම හා තැපැල් ප්‍රමාදයන් හේතුවෙන් සමහර දිස්ත්‍රක් වල ධාවන සටහන් ප්‍රමාද වීම සිදු විය. 2020,2021 වර්ෂ වල ධාවන සටහන් 2022.06.22 දින  විගණනයට ඉදිරිපත් කර ඇත.

(ආ)

1 අධිකාරිය විසින් මින් ඉදිරියට මෙවැනි අත්තිකාරම් ලබා දීම සිදු නොකරනු ලබයි.

11

a සංජය ප්‍රසාද් ජයමාන්න මහතා

විශේෂඥ උපදේශකවරයෙකු (Consultant) ලෙස සංජය ප්‍රසාද් ජයමාන්න මහතා 2020.01.06 දින සිට මාස 06ක කාලයක නිශ්චිත රාජකාරී පැවරීමක් මත (TOR) පත් කර ඇත. IT Related Projects, Electronics Automation and Robotics, Hospitality and Tourism ක්ෂේත්‍රවලට විශේෂඥ දැනුමක් සහිත පුද්ගලයින් කාර්යමණ්ඩලය තුළ නොසිටි බැවින් එම ක්ෂේත්‍රවලට අදාළ ව්‍යාපෘති වලට විශේෂඥ තාක්ෂණික උපදෙස් ලබා ගැනීම අපේක්ෂා කර ඇති අතර, 2020.02.14 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. මාස 02ක කාලයකට පසු එනම් , 2020.03.02 දින සිට සංජය ජයමාන්න මහතා උප සභාපති තනතුරට පත් කර ඇත.

සී.ටී.එන්.ජයවර්ධන මහතා

විශේෂඥ උපදේශකවරයෙකු (Consultant) ලෙස සී.ටී.එන්.ජයවර්ධන මහතා 2020.03.02 දින සිට 2020.09.01 දින දක්වා, මාස 06ක කාලයකට නිශ්චිත රාජකාරී පැවරීමක් මත (TOR) පත් කර ඇත. රූපවාහිනී ඩිජිටල්කරණය පිළිබඳව හා මාධ්‍ය ආයතන සමඟ සමීප සබඳතාවයක් ඇති පුද්ගලයින් කාර්ය මණ්ඩලය තුළ නොසිටි බැවින් Digital TV Channel and Promotional Activities සඳහා විශේෂඥ දැනුම ලබා ගැනීම අපේක්ෂා කර ඇති අතර, 2020.02.28 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා ඇත. 2020.09.02 දින සිට 2021.03.01 දින දක්වා මාස 06 බැගින් වූ කාල සීමාවන් තුනක් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත උපදේශන සේවාව ලබා ගෙන ඇත.

ඇ ආයතනයේ සභාපති වෙත දීමනා ගෙවීමේදී PED 1/2020 හා 2020 ජනවාරි 21 දිනැති භාණ්ඩාගාර ලේකම්ගේ චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතු බව අවධාරණය කරමින් අදාළ නිලධාරීන් දැනුවත් කිරීමට උපදෙස් දෙන ලදී.

2.2.4

(අ) 2020 - 2021 වර්ෂය සඳහා ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියට අයත් දිස්ත්‍රික් හා ජාතික මධ්‍යස්ථාන 23ක් සඳහා ආරක්ෂක සේවාව ලබා ගැනීමට අදාල මිල කැඳවීම් අනුව අවම මිල ඉදිරිපත් කර තිබූ ආයතනය විසින් පොදු කාර්යය පිරිවැය හා ලාභාංශ රහිතව මිල ගණන් ඉදිරිපත් කර තිබුනි. ප්‍රායෝගිකව ගුණාත්මක සේවාවක් පවත්වාගෙන යාමට මෙම වියදම් අත්‍යාවශ්‍යන්ම ඇතුලත් විය යුතු බව ප්‍රසම්පාදන කමිටුවේ අදහස විය. පොදු පිරිවැය හා ලාභාංශ නොමැතිව අවම මිල පමණක් ඉදිරිපත් කිරීම තුලින් සේවාව පවත්වාගෙන යාමේදී ආයතනයට ප්‍රායෝගික හා ගුණාත්මක සේවාවක් පවත්වාගෙන යාමට නොහැකි බවත් අවම මිල යනු එක් සාධකයක් පමණක් බැවිනුත් අධිකාරියට ගුණාත්මක හා කාර්යක්ෂම සේවාවක් ලබා ගැනීමේ අරමුණ සාක්ෂාත් කර ගැනීමට සෑම අතින්ම සුදුසුකම් සපුරා ඇති ලාභාංශ හා පිරිවැය ඇතුලත්ව මිල ගණන් ඉදිරිපත් කර ඇති සුදුසුකම් ලත් දෙවන ලංසුකරු දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් ආරක්ෂක සේවාව සැපයීම සඳහා තෝරා ගන්නා ලදී.

(ආ) මෙම ව්‍යාපෘතිය සැලසුම් කිරීමේදී ඉංජිනේරු ඇස්තමේන්තුව සැකසීම සඳහා තරඟකාරී මිල කැඳවීමක් මගින් තෝරා ගත් Engineering Design & Construction Company (PVT) (ED&CC) විසින් 2016 වසරේ සිදු කරන ලදී. මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලද්දේ 2017 වසර අග භාගය වන විට බැවින් එක් ගොඩනැගිල්ලක් අවශ්‍යතාවය මත නවීකරණ කටයුතු සංශෝධනය කරන ලදී. එබැවින් 2018 වසරේදී එම අවශ්‍යතාවයට අනුව ප්‍රමාණ පත්‍රය සංශෝධනයක් කිරීම සිදු විය (NPA Supplementary 14/ 8.13.4).

මෙම ව්‍යාපෘතිය සඳහා තෝරා ගත් ලංසුකරුවා ඉදිරිපත් කර ඇති ලංසුව සියළුම පූර්ව සුදුසුකම් සපුරා ඇති අවම මිල සහිත (Substantially Responsive Bidder) ලංසුකරුවා විය.

මෙම ව්‍යාපෘතියේ පසු කොන්ත්‍රාත් පරිපාලන කටයුතු සඳහා උපදේශන සේවා ආයතනය ලෙස රාජ්‍ය ආයතනයක් වන රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව (ශ්‍රා ක) තෝරා ගන්නා ලදී. එම ආයතනය විසින් නිර්දේශ කර එවන ලද ගෙවීම් අප ආයතනය විසින් කොන්ත්‍රාත්කරු සඳහා ලබා දෙනු ලැබේ.

මෙම විගණන විමසුම විසින් පෙන්වා දුන් කරුණු එම ආයතනයට යොමු කළ අතර ඒ සඳහා පිළිතුරු ලිපියක් 2022.05.26 දිනැතිව මේ වන විට අප වෙත යොමු කර ඇත. එම පිළිතුරු ලිපිය ඉදිරි කටයුතු සඳහා අභ්‍යන්තර විගණන අංශයට යොමු කර ඇත.

2.3

(අ) 1996 වර්ෂයේ ආරම්භ කරන ලද ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය සියලු සේවකයන් සඳහා මාසිකව වැටුප් ගෙවීමේදී සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට නියමිත පරිදි මාසිකව දායක මුදල් ප්‍රමාදයකින් තොරව ගෙවා ඇත.

රජයේ තීරණයක් මත 2006 වර්ෂයේ සිට රාජ්‍ය සේවකයින් සඳහා වැටුපට එකතුකර මාසිකව ජීවන වියදම් දීමනාවක් ගෙවීම තීරණය කර තිබුණි. එවකට සිටි නිලධාරීන් මෙම දීමනාව අන්තර් දීමනාවක් ලෙස හඳුනාගෙන තිබුණ නිසා ඒ සඳහා සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට දායක මුදල් ගණනය කර ගෙවීම් කර නොතිබුණි.

මේ සම්බන්ධව 2015.05.28 දින කම්කරු දෙපාර්තුමේන්තුවේ විශේෂ විමර්ශන අංශයේ නිලධාරීන් පැමිණ කරන ලද පරීක්ෂණයට සහ උපදෙස් වලට අනුව 2006 වර්ෂයේ සිට 2015 මැයි මාසය දක්වා කාලයට අදාළව දායක මුදල් ගණනය කර ඇත. මේ සඳහා අවශ්‍ය මුදල් 2016 ඔක්තෝම්බර් මාසයේ සිට භාණ්ඩාගාරයෙන් වාරික 04කින් ලබා ගෙන ස්ථිර ගෙවීම් සිදු කර තිබේ. පසුව සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල් මණ්ඩලයේ ප්‍රාදේශීය කළමණාකරු විසින් මේ සඳහා අධිභාර මුදල නොගෙවන්නේ නම් නීති මගින් කටයුතු කරන බව දැනුම් දීමෙන් පසු අධ්‍යක්ෂ මණ්ඩලය වෙත කරුණු ඉදිරිපත් කර අනුමැතිය ලබා ගෙන වාරික 12කින් අධිභාර මුදල ගෙවන ලදී.

තත්වය නිලධාරීන්ගේ නොසැලකිල්ලෙන් සිදු වූවක් නොවන අතර මෙම දීමනාව අන්තර් දීමනාවක් ලෙස වැරදි ලෙස අර්ථ නිරූපණය කරගැනීමෙන් සිදුවූවක් බව පැහැදිලි වේ.

(ආ) අදාළ උපකරණ ඒ ඒ ස්ථාන වල විධිමත් පරිදි ස්ථානගත කිරීමට කටයුතු කර ඇත.

අක්‍රියව පැවති උපකරණ 07 මේ වන විට ශ්‍රී ලංකාවේ නියෝජිත ආයතනයක් වෙත දන්වා අලුත්වැඩියා කර ඇති අතර බෙහෙත් වර්ග වෛද්‍ය නිර්දේශ නොමැතිව භාවිතයට ගත නොහැකි අතර තුවාල වීම්, තැලීම් සඳහා භාවිතයට ගත හැකි ද්‍රව්‍ය පමණක් භාවිතයට ගැනීමට කටයුතු කර ඇති බව කාරුණිකව දන්වමි.

(ඇ) ගාල්ල දිස්ත්‍රික්කයේ 2016 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා පවත්වන ලද පුහුණු පාඨමාලා වල අවසන් ඇගයීම් පැවැත්වීම හා නොපැවැත්වීම පිළිබඳව හේතු සාධක ඇමුණුම 01 මගින් දක්වා ඇත. එම පුහුණු පාඨමාලා අතුරින් අවසන් ඇගයීම් සඳහා සහභාගී නොවූ බහුතරයක් බන්ධනාගාරයෙන් නිදහස් වූ රැඳවියන් විය.

(ඈ) මේ සම්බන්ධව අභ්‍යන්තර විගණන පරීක්ෂණයක් සිදු කර 2022.06.21 දින වාර්තාව ලැබී ඇත.

ඒ අනුව ඉදිරි කටයුතු සිදු කිරීමට අපේක්ෂා කරමි.

චුලංගනී පෙරේරා,
අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය.